**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව- 2022**

**--------------------------------------------------------**

**1.	මූල්‍ය ප්‍රකාශන**

**1.1	ව්‍යාවනය කළ මතය**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍යප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේවිධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2	ව්‍යාවනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනයකරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ ව්‍යාවනයකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3	මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවපිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාවඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේඅඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේමූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධවපරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද,මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති3 හි 47 ඡේදය ප්‍රකාරව අස්තිත්වය විසින් ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේදයේවැරදි, අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවත්, එසේ ගැළපීම් නොකර සමාලෝචිත වර්ෂයට ගැළපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ කළුගල් බදු ආදායම රු.69,742,587 ක සෘණ අගයක් ගෙන තිබුණි. | කළුගල් ඉඩම් බදු දීම් වලට නිශ්චිත ක්‍රමවේදයකට බදු ලෙජරයක් පවත්වා නොතිබීමෙන් ලැබිය යුතු ආදායම නිශ්චිතව මූල්‍ය ප්‍රකාශන වලට ගැළපීමට නොහැකි වී ඇත. ව්‍යාපෘති අංශය හා දිස්ත්‍රික් කාර්යාල තොරතුරු මූල්‍ය ප්‍රකාශන වලට හා විගණන අංශ වෙත ලබාදීමේදී ඒවායේ පරස්පරතාවය නිසා විගණන විමසුම් හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදි අවධානය යොමු වී ඇත.සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය තුළ පෙන්නුම් කරන බදු ලෙජර් සකස් කිරීමට නොහැකි වූ බදුකරුවන්ට අදාළව ඔවුන්ගේ ආරම්භක ශේෂය හෝ ගිණුම් වලින් පෙන්විය යුතු වුවත් එම ශේෂයන් නොසලකා සම්පූර්ණ ප්‍රමාණය ඉවත් කිරීම තුළ කළුගල් බදු ආදායම සෘණ අගයක් පෙන්නුම් කර ඇත. දැනට බදු ලෙජරය සකස්කර අවසන් කර ඇති බැවින් එම තොරතුරු 2023.12.31 දිනට අවසන් ගිණුම් වාර්තා තුළ ගැළපීම මත මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බවට දන්වමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති අනුව පූර්ව කාලපරිච්ඡේදයේ වැරදි නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති 3 හි 7 ඡේදය ප්‍රකාරව උපචිත පදනම අනුව ගනුදෙනු, අනෙකුත් සිදුවීම් සහ තත්ත්වයන් ඒවා සිදු වන අවස්ථාවේ හඳුනාගන්නා පදනම මත ගිණුම්ගත කළ යුතු වුවත්, පෙර වර්ෂයට අදාළව මෙම වර්ෂයේදී ගෙවීම් කර තිබුණු ඉන්ධන හා වාහන කුලී පදනම මත ලබා ගැනීම වෙනුවෙන් දරන ලද එකතුව | 2023 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි නිවැරදි කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතිය ප්‍රකාරව වියදම් උපචිත පදනමට ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.5,600,567 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස හඳුනා ගැනීම නිසා එම වටිනාකමෙන් අදාළ වියදම් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 ප්‍රකාරව දේපළ,පිරියත හා උපකරණ වෙනුවෙන් දරන පසුකාලීන පිරිවැය තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ සෘජුවම වැඩිවීමක් සිදුවන්නේ නම් පමණක් දේපළ, පිරියත හා උපකරණ වල අගය වැඩිවීමක් ලෙස හඳුනාගන්නා ලෙස දක්වා තිබුණ ද, එවැනි වියදමක්සේ සැලකිය නොහැකි රු.634,441 ක ගොඩනැගිලි අලුත්වැඩියා වියදම 2022 වර්ෂය තුළ අත්පත් කරගන්නා ලද ගොඩනැගිලිවල ශේෂයට ඇතුළත් කර ඒ සඳහා ක්ෂය වෙන්කිරීම් ලෙස රු.36,662 ක් වෙන්කර තිබුණි. | 2022 වර්ෂයේ දී රු. 754,400ක වටිනාකමකට මොණරාගල දිස්ත්‍රික් කාර්යාලය අලුත්වැඩියා කර ඇත.ඒ අනුව ගොඩනැගිල්ලෙහි වටිනාකම වැඩිවීමක් සිදු වී ඇති බැවින් ස්ථාවර වත්කම් තුළ ඇතුළත් කර වර්ෂ අවසාන ක්ෂය වෙන්කිරිම සිදු කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතිය ප්‍රකාරව ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 20 අනුව භෞතිකව නොපවතින මූල්‍ය නොවන වත්කම් අස්පෘෂ්‍ය වත්කම් ලෙස හඳුනාගත යුතු අතර එහි ඵලදායි ජීව කාලය පුරා ක්‍රමක්ෂය කළ යුතු වුවද, රු.10,120,040 ක පිරිවැයක් වූ මෘදුකාංග පද්ධතිය අස්පෘෂ්‍ය වත්කම් ලෙස හඳුනාගැනීම වෙනුවට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ලී බඩු සහ කාර්යාල උපකරණ තුළ ඇතුළත් කර ඒ සඳහා ක්‍රමක්ෂය වෙන්කිරීම වෙනුවට රු.2,024,080 ක ක්ෂය වෙන්කිරීමක් සිදු කර තිබුණි. | කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය මඟින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව කොමිෂන් සභාව විසින් ස්ථාවර වත්කම් වර්ගීකරණය කර ඇත. ඒ අනුව අස්පෘශ්‍ය වත්කම් ගණයට අයත් වන පරිගණක මෘදුකාංග නම් වූ කොටස ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ යටතේ වෙනම අනු කොටසක් ලෙස අප විසින් පවත්වාගෙන යනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුව භෞතිකව නොපවතින මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කරන බව මූල්‍ය ප්‍රකාශනවල අංක 1.6.2 දරන ගිණුම් ප්‍රතිපත්තියෙහි සඳහන් කර තිබුණද, ආයෝජන ආදායම් ඉඩම් බදුකුලී ආදායම් හා ඒ මත අයකරන අධිභාර, කළුගල් බදු ආදායම් ,ඉඩම් අත්පත් කර ගැනීම් සහ ඉඩම් විකුණුම් ආදායම් හැර පොල් ආදායම්, ඛණිජ ආදායම්, ලියාපදිංචි ආදායම් වැනි ආදායම් වර්ග 16 කට අදාළ එකතුව | මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 15 යටතේ පෙන්නුම් කරනු ලබන අනෙකුත් මෙහෙයුම් ආදායම් යටතට පරිපාලන ගාස්තු, අයදුම්පත් ගාස්තු, පොල් ආදායම්, කොමිෂන් සහා ගාස්තු, වගා ආදායම්, ලිපි නිකුත් කිරීම, ආදායම්, ඡායා පිටපත් ගාස්තු, ව්‍යාපෘති ගාස්තු, ඉඩම් බදු අධිභාර, ඉඩම් විකුණුම් අයභාර, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම්, ඉස්සෝ ආදායම්, මැනුම් අධීක්ෂණ ගාස්තු, දැව ආදායම්, පරිහරණ ගාස්තු, වැලි ආදායම්, පස් ආදායම්, ලිදුල බංගලාවේ ආදායම් සහ ප්‍රවේනි | ගිණුම් ප්‍රතිපත්ති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කළ යුතුය. |

| | |
|---|---|
| රු.27,057,727 ක් වූ ආදායම් මුදල් පදනම මත ගිණුම් ගත කර තිබුණි. | ආදායම් ඇතුළත් වේ.මෙම ආදායම් නිශ්චිතව හඳුනා ගත නොහැකි බැවින් උපචිත පදනම මත ගිණුම් තැබීමට හැකියාවක් නොමැත. තව ද අයදුම්පත් ගාස්තු, ලිපි නිකුත් කිරීම, ඡායා පිටපත්, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම්, දැව ආදායම් තෙවන පාර්ශවයක් විසින් සිදුකරනු ලබන ඉල්ලීම් පදනම්ව ලැබෙන ආදායමක් බැවින් එය කලින් හඳුනා ගත නොහැක. අනවසර ඉඩම් භුක්ති විඳින පුද්ගලයින් වෙතින් අනවසර පරිහරණ ගාස්තුවත් සින්නක්කර ඔප්පුවක් මඟින් බැහැර කරන අවස්ථාවේ දී අයකරනු ලබයි.මෙම මුදල ඔප්පුවක් ලබාදෙන තෙක් අයකරන ගාස්තුවක් බැවින් හා අනවසර අල්ලා ගැනීමට නීත්‍යානුකූල කිරීමක් වන නිසාවෙන් මෙය හුදෙක් ඉදිරියට කොපමණ ආදායමක් ලැබේද යන්න පිළිබඳ පුරෝකතනය කර ගිණුම් වල ගැළපීම නීත්‍යානුකූල නොවන බව ද දන්වමි. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු කළුගල් බදු ආදායමෙන් රු.86,586,842 ක් කළුගල් බදු ආදායම් ගිණුමට හර කර ලියා හැර තිබුණු නමුත් එසේ කිරීමට හේතුව පැහැදිලි කර නොතිබුණි. මෙම ශේෂයට අදාළ කළුගල් බදුකරුවන් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. | 2022.12.31 දිනට බදු ලෙජර් 21 ක කටයුතු අවසන් කර තිබූ අතර ඉන් බදුකරුවන් 17 දෙනකුට අදාළ ලැබිය යුතු මුදල රු. 80,756,451 ක් අවසන් ගිණුම් වලට ගැලපීම් කර ඇත. | බදුකරුවන් නිශ්චිතව හඳුනාගෙන බදු කුලී ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 1972 වර්ෂයේ කොමිෂන් සභාව පිහිට වූ දින සිට අත්පත් කරගත් ඉඩම්වලට අදාළ, ඉඩම් අක්කර ගණන, එක් එක් ඉඩම් පිහිටි ප්‍රදේශ, අත්පත් කරගනු ලැබුවේ කවරෙකුගෙන්ද, දැනට බුක්තිය පවරාදීම් පිළිබඳ විස්තර හා අදාළ ගැසට් නිවේදන සහ ඉඩම් බැහැරකිරීම්වලට අදාළ සියලුම විස්තර පිළිබඳ වූ සම්පූර්ණ තොරතුරු ඇතුළත් ලේඛනයක් ආයතනය විසින් නඩත්තු කර නොතිබුණු අතර, ඒ පිළිබඳ උපයෝගී ලියවිලි මඟින් පැහැදිලි කිරීමටද ආයතනය අපොහොසත්ව ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.676,169,345 ක් වූ පවරාගත් ඉඩම්වල පැවැත්ම හා අගය කිරීමේ නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී සෑහීමට පත්විය නොහැකි අතර 2022 | විධිමත් හා කාලීනව යාවත්කාලීන වූ ඉඩම් ලේඛනයක් කොමිෂන් සභාව සතුව නොමැත. මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කරනුයේ 1975 වර්ෂයේ ඉඩම් වටිනාකම වූ රු. 890,959,772 ක් වේ.පසු වර්ෂවල සිදු වූ ඉඩම් බැහැර කිරීම් වලින් පසුව 2006 වර්ෂයේ දි ඉඩම් වල වටිනාකම රු.676,169,346 ක් වන අතර මේ දක්වා එම වටිනාකම නොවෙනස්ව පවතී. මෙම ගැටලුව නිරාකරණය කිරීමට යාවත්කාලීන ඉඩම් ලේඛනයක් අදියර 04 ක් යටතේ සකස් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කර ඇත. එනම්,<br>I. ප්‍රකාශ කරන ලද සියලුම ඉඩම් දිස්ත්‍රික් මට්ටමින් පරිගණක ගත කිරීම.<br>II. ප්‍රකාශ කරන ලද ඉඩම්වලින් පනතේ විධිවිධාන ප්‍රකාරව නීතිමය බැඳීම් ලෙස නිදහස් කරන ලද ඉඩම්, ඉඩම් ලේඛනයෙන් ඉවත් කර සභාව සතු වූ ඉඩම් ප්‍රමාණය හඳුනා ගැනීම. | අත්පත් කර ගත් ඉඩම් ලේඛනයක් නඩත්තු කර යාවත්කාලීන වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාව සතුව අක්කර 424,809 ක් පැවති බවට 2023 අප්‍රේල් 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කළ වාර්තාවේ සඳහන් කර තිබුණි. ඒ අනුව ඉඩම් අක්කරයක වටිනාකම රු.1,591 ක් තරම් ඉතා අඩු අගයක් ගෙන ඇති බව විගණනයට නිරීක්ෂණය විය. | III. සභාව විවිධ කටයුතු සඳහා බැහැර කරන ලද ඉඩම් ඉවත් කිරීම.<br>IV.සභාව සතුඉඩම් ක්ෂේත්‍රයෙන් හඳුනාගැනීම, මැනුම් කිරීම සහ ප්‍රත්‍යාගණනය කිරීම.<br>මෙම අදියර 04න් මුල් අදියර 02හි කටයුතු අවසන් කර ඇති අතර 03වන අදියරේ කටයුතු සති තුනක් තුළ අවසන් කිරීමට සැලසුම් කර ඇත. | |
| (ඇ) | 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාරව, වතු සමාගම්වලින් සහ පුද්ගලයන්ගෙන් පවරාගත් ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු වන්දි අවිනිශ්චිත (අදියර - I සහ II) ගිණුමෙහි පැවති එකතුව රු.215,745,462 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂය අවසන්වන විට නිරවුල් කර නොතිබුණු අතර, වගකීමේ ස්වභාවය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ගිණුම් සටහන් මගින්ද හෙළිදරව් කර නොතිබුණි. | කොමිෂන් සභා පනත ප්‍රකාරව වතු සමාගම්වලින් සහ පුද්ගලයන්ගෙන් පවරාගත් ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු වන්දි අවිනිශ්චිත අදියර 01 සහ 02 වෙනුවෙන් පවතින ශේෂය නිරවුල් නොවීමට බලපා ඇති ප්‍රධාන හේතු වන්නේ ප්‍රකාශකයින්ගේ හිමිකම් තහවුරු කරගැනීම,නෛතික ලේඛන ඉදිරිපත් නොකිරීම, නෛතික බැඳීම් යටතේ ප්‍රකාශකයින් වෙත ඉඩම් නිදහස් කළ යුතුව පැවතීම,ප්‍රකාශිත ඉඩම් සම්බන්ධ අධිකරණ ක්‍රියාමාර්ග, වන්දි ප්‍රදාන ලිපිය නිකුත් කිරීමෙන් පසු එම මුදල ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ලබා ගැනීම ප්‍රතික්ෂේප කිරීම හා ඉඩම් අත්පත් කරගැනීමේ සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනා ඉදිරිපත් කිරීම සහ ව්‍යවස්ථාපිත වන්දි මුදලක් ලබාදීම හේතුවෙන් එය ප්‍රමාණවත් නොවීම හේතුකොටගෙන වන්දි ලබාගැනීමට ඉදිරිපත් නොවීම යනාදී කරුණු වේ. | අවිනිශ්චිත ගිණුම් ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2022 මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 5.3 මගින් කළුගල් ඉඩම් බදු කරුවන් 17 දෙනෙකුගෙන් ලැබිය යුතු බදු කුලී ආදායමරු.80,756,451 ක් ලෙස හඳුනා ගෙන ඇතත් 2023 මැයි 02 වන දින විගණනයට ඉදිරිපත් කරන ලද බදු ලෙජරය අනුව, කළුගල් බදු කරුවන් 93 දෙනෙකුගෙන් 2022 දෙසැම්බර්31 දිනට රු. 293,891,542 ක් ලැබිය යුතු බවට පසුව හඳුනා ගෙන තිබුණි. ඒ අනුව ලැබිය යුතු රු. 213,135,091 ක කළුගල් බදු ආදායම මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි. | මූල්‍ය ප්‍රකාශන විගණන දිනට බදු ලෙජරය බදු කරුවන් 93 දෙනකුට අදාළව සකස්කර අවසන් කර තිබුණද මූල්‍ය ප්‍රකාශන සකස්කර අවසන් කළ යුතු 2022.12.31 දිනට අවසන් කර තිබූ බදුකරුවන් 17 දෙනාට අදාළ තොරතුරු ගැළපීම් කර ඇත. ඒ අනුව 2023.12.31 දිනට සියලුම බදුකරුවන්ට අදාළ තොරතුරු මූල්‍ය වාර්තා වලට ගැළපීම් සිදුකරන බවට දන්වමි. | බදු ලෙජරය නිවැරදි කිරීම් කඩිනමින් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කොමිෂන් සභාවේ ඉඩම් බල මණ්ඩල පිහිටි මොණරාගල, රත්නපුර සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වල කාර්යාල ගොඩනැගිලි පිරිවැය පිළිවෙළින් රු. 1,350,000, රු.7,000,000 සහ රු. 5,700,000 ක් වුවදඑම ගොඩනැගිලි පිහිටා ඇති ඉඩම්වල වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දේපළ, පිරියත හා උපකරණ වල දක්වා නොතිබුණි. | මොණරාගල, රත්නපුර සහ පුත්තලම යන දිස්ත්‍රික් ඉඩම් බල මණ්ඩල පිහිටා ඇති ඉඩම් මැනුම් කර මේ වන විට පිඹුරු පිටපත් පිළියෙල කර අවසන් කර ඇත.එම පිඹුරු පිටපත් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර තක්සේරු වටිනාකම ලබාගැනීමෙන් පසු 2023 මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | දේපළ, පිරියත හා උපකරණ වල නිවැරදි කිරීම් කඩිනමින් සිදු කළ යුතුය. |
| (ඊ) | හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හදනගොඩ වත්තේ පිඹුරු අංක 4290 හි කැබලි අංක 01 ට අදාළ හෙක්ටයාර් 0.4443 ක් සුනාමි නිවාස ව්‍යාපෘතියකට ලබාදීම වෙනුවෙන් හික්කඩුව ප්‍රාදේශීය ලේකම් විසින් ලැබිය යුතු වන්දි මුදල රු.5,300,000 ක් වුවද, සදොස් ලෙස එය රු.53,000,000 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම හා ණයගැතියන් රු.47,700,000 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | කොමිෂන් සභාව වෙත ලැබිය යුතු වන්දි මුදල රු.5,300,000 රත්ගම ප්‍රාදේශිය ලේකම් විසින් 2023.02.03 වන දින ගෙවා ඇත.අගය අත්පත් හා විමර්ෂණ අංශය මගින් වැරදීමකින් රු.53,000,000 ක් ලැබිය යුතු ආදායම් ලෙස දැක්වීම හේතුවෙන් රු.47,700,000 ක් වැඩියෙන් ගිණුම් ගත වී තිබේ. එය ඉදිරි මූල්‍ය වර්ෂයට අදාළව නිවැරදි කරන ලෙස උපදෙස් ලබාදී ඇත. | ආදායම හා ණයගැතියන් නිවැරදිකිරීම කළ යුතුය. |
| (උ) | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලිදුල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පිඹුරු අංක 2736 හි කැබලි අංක 01, 02 හා 03 යන කොටස් ලිදුල පොලිස් ස්ථානය සඳහා අත්පත් කර ගැනීම වෙනුවෙන් වූ රු.4,016,000 ක වන්දි මුදල 2022 ඔක්තෝබර් මස 17 දින ලැබී ගිණුම් ගත කර තිබියදී නැවත ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම හා ණයගැතියන් එම වටිනාකමෙන් වැඩියෙන් පෙන්නුම් කරන බව නිරීක්ෂණය විය | අත්කර ගැනීමට වන්දි මුදල 2022.10.17 දින කොමිෂන් සභාවට ලැබී ඇත.එය නැවතත් අත්පත් අංශය මගින් ලැබිය යුතු මුදලක් සටහන් කිරීම හේතුවෙන් ගිණුම්ගත වී ඇත. එය ඉදිරි මූල්‍ය වර්ෂයට අදාළව නිවැරදි නිවැරදි කරන ලෙස උපදෙස් ලබාදී ඇත. | ආදායම හා ණයගැතියන් නිවැරදිව ගණනය කිරීමකළ යුතුය. |
| (ඌ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති 10 හි අරමුණ වන්නේ අගය හුවමාරුවන ගනුදෙනු හා සිද්ධීන් ගෙන් පැන නගින අයහාරය හඳුනා ගැනීම වන අතර ඒඅනුව අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්තිත්වයට ගලා ඒම නිශ්චිත වන විට හා එම ප්‍රතිලාභ විශ්වසනීය ලෙස මැනිය හැකි වන විටදීය.ඒඅනුව ගාල්ල දිස්ත්‍රික්කයේ, ඉමදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, දීගොඩ අතිරේක ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මොරගොල්ල | කොමිෂන් සභාව අක්කර : 21 රූඩ් : 1 පර්චස් : 10 ක් කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයට ලබාදී ඇත. එකී ඉඩම අත්කර ගැනීමට වැය වන රු. 75,000,000 ක මුදල ගෙවීමට 2017.12.19 දින අයවැය අධ්‍යක්ෂ ජනරාල් අනුමැතිය මත මෙම වන්දි මුදල මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර තිබේ. නමුත් 2018 වර්ෂයේ සිට මෙම අත්කර ගැනීමට කටයුතු සිදු නොවූ බැවින් මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් වෙත දුරකථනයෙන් තොරතුරු විමසීමේදී මෙකී අත්කර ගැනීමට අදාළ වන හෙක්ටයාර් 8.6250 ක ප්‍රමාණය බැහැර කිරීමට අදාළ වතු | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතිය ප්‍රකාරව අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්තිත්වයට ගලා ඒම නිශ්චිත වන විට හා එම |

| | | | |
|---|---|---|---|
| | වත්තේ, හල්ගස්මුල්ල කන්ද නැමති ඉඩමෙන් අක්කර 21 රූඩ් 01 පර්චස් 10 ක් කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ ශාඛාවක් ඉදිකිරීම සඳහා කොමිෂන් සභාවේ අවසරය මත ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 2 වන වගන්තිය යටතේ දැන්වීම ඉමදූව ප්‍රාදේශීය ලේකම් විසින් 2018 අගෝස්තු 08 දින අත්සන් කර තිබුණි. කෙසේ නමුත් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 17 වගන්තිය යටතේ තීරණය ප්‍රාදේශීය ලේකම් වෙතින් ලැබුණු විට අස්තිත්වයට අදාළ වන්දි මුදල ලැබීමේ හැකියාව නිශ්චිතව හඳුනා ගත හැකි වුවත් එම තීරණය ලැබී නොතිබියදී නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය පදනම් කරගෙන ඉඩමේ වන්දි මුදල රු.75,000,000 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස හඳුනා ගෙන ගිණුම්ගත කර තිබුණි. එසේම ඉඩමෙහි ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට අදාළ අවසරය 2018 වර්ෂයේදී ලබා දුන්නද 2022 වන විට වසර 04 ක් ගත වී ඇතත් ආරවුල් පැන නැගීම නිසා පැවරීමේ කටයුතු නිම කිරීමට නොහැකි වී තිබුණි. | කළමණාකරු විසින් විරෝධතාවයක් ඉදිරිපත් කර ඇති බව අංක 4-3/2/2018/VI/32 හා 2020.06.12 දිනැති ලිපිය මඟින් තවත් අයටද පිටපත් සහිතව ලේකම් නිපුණතා සංවර්ධන රැකි රක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය වෙත ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ ( ඉඩම් අත්පත් ) විසින් ලිපියක් යොමු කරන ලද බව අප වෙත දන්වා තිබේ. ඒ අනුව මෙම ඉඩම අත්කර ගැනීම තවදුරටත් ක්‍රියාත්මක වන්නේද යන්න ඉමදූව ප්‍රාදේශීය ලේකම් වෙතින් විමසා ඇති අතර ඊට පිළිතුරු ලද පසු ඉදිරි කටයුතු කරනු ලැබේ. | ප්‍රතිලාභ විශ්වසනීය ලෙස මැනිය හැකි වන විටදී අයභාරය හඳුනාගත යුතුය. |
| (එ) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගාර්ට්ලන්ඩ් වත්ත නැමති ඉඩමට අදාළ පිඹුරු අංක 12820 හි කැබලි අංක 01 න් දැක්වෙන අක්කර 256 රූඩ් 01 පර්චස් 22 ක් හා හාවානිලාවත්ත නැමැති ඉඩමට අදාළ පිඹුරු අංක 12821 හි කැබලි අංක 01 හා 02 න් දැක්වෙන අක්කර 118 පර්චස් 38 ක ඉඩම් දෙකක් කොමිෂන් සභා පනතේ 22(1) (ආ) වගන්තිය ප්‍රකාරව පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත බදු පදනම මත බැහැර කිරීමට 2021 මැයි 05 වන දින අනුමතකර තිබුණි. ඒ අනුව අයකළ යුතු වාර්ෂික බදු කුලිය 2022.10.13 සහ 2022.11.18 ලිපි මගින් පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපති දැනුවත් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාළ බදු කුලිය වූ පිළිවෙලින් රු.12,800,000 ක් හා රු.6,720,000 ක් වශයෙන් එකතුව රු.19,520,000 ක ඉඩම් බදු ආදායම් | 2022.12.31 දිනට මෙම පැවරීමට අදාළ මූල්‍ය ප්‍රකාශන තුළ ගැළපීම් කිරීමට නොහැකි වී ඇත. දැනට ලෙජරය සකස් කර බදුකරුද දැනුවත් කර ඒ අනුව ඉදිරි මූල්‍ය වර්ෂයේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි.<br>හාවානීල වත්ත නැමැති ඉඩමට අදාළව ආදායම් අංශය මඟින් අදාළ ගොනු සකස් කර ලෙජරයට ඇතුළත් කිරීමට සිදු වූ ප්‍රමාදය මත මෙය ගිණුම් වලින් මඟ හැරී ඇති අතර දැනට ලෙජරය සකස් කර බදුකරු දැනුවත් කර ඇත. | සමාලෝචිත වර්ෂයේ ආදායම හා ණය ගැතියන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලෙස හඳුනා ගෙන නොතිබුණු නිසා 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආදායම හා ණය ගැතියන් අඩුවෙන් පෙන්නුම් කරන බව නිරීක්ෂණය විය. | | |
| (ඒ) | අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ඌරණිකාඩු ඉඩමෙන් අක්කර 08 රූඩ් 01 පර්චස් 11.48 ක් සංචාරක හෝටල් ව්‍යාපෘතියක් සඳහා පුද්ගලික සමාගමක් විසින් 2019 සිට 2023 දක්වා කාලයකට බදුගෙන තිබුණි.එම ඉඩම සඳහා වාර්ෂික බදු මුදල වර්ෂ 5ක් වෙනුවෙන් වූ මුළු බදු ආදායම 2018 හා 2020 වර්ෂයේදී ලැබී එම වර්ෂවල ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ නිසා 2022 ඉඩම් බදු ආදායම රු.748,800 ක් හා 2023 වර්ෂය වෙනුවෙන් ලද රු.748,800 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඌරනිකාඩු ඉඩමෙන් අක්කර 08 රූඩ් 01 පර්චස් 11.48 ක බිම් ප්‍රමාණය හෝටල් ව්‍යාපෘතියක් සඳහා අප්රෝටා සහ පබ්රා පුද්ගලික සමාගම වෙත 2019.01.01 දින සිට බදු පදනම මත ලබා දී ඇත.2019.01.01 – 2023.12.31 දක්වා මුල් වසර 05 ට අදාළ බදු මුදල 2018.07.30 හා 2020.08.25 දිනැතිව ගෙවා තිබුණි. මෙම බදු අයකිරීමට අදාළව රිසිට්පත අම්පාර දිස්ත්‍රික් කාර්යාලය මඟින් නිකුත් කර තිබුණි. රිසිට්පත නිකුත් කර වසර 02 ක් ගතවී තිබුණු නිසාවෙන් එය සංශෝධනය නොකරන ලද අතර 2023 වසරට අදාළ බදු ගැළපීමේ දී ජර්නල් සටහන් මඟින් රු.748,800.00 ක බදු මුදල ගැළපීම් කිරීමට සටහන් කරගන්නා ලදි. | 2023 වර්ෂයේ ගිණුම් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | කොමිෂන් සභාව විසින් ඉඩම් බදුදීමේදී ඉඩමේ බදු මුදල තක්සේරු කිරීම වෙනුවෙන් බදු ගැනුම්කරු ගෙන් අය කරනු ලබන සේවා ගාස්තුව අදාළ ඉඩම තක්සේරුව සිදුකළ වර්ෂයේ ආදායමක් ලෙස හඳුනා නොගෙන එම මුදල් ලැබෙන වර්ෂයේදී මුදල් පදනම මත ගිණුම් ගත කර තිබුණි. 2022 වර්ෂයට පිළියෙල කරන ලද ඉඩම් බදු ලෙජර් අනුව ලැබිය යුතු තක්සේරු සේවා ගාස්තුව වූ රු.3,890,125 ක් ලැබිය යුතු ආදායමක් ලෙස හඳුනා ගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ණය ගැතියන් එම අගයෙන් අඩුවෙන් පෙන්නුම් කරන බව නිරීක්ෂණය විය. | 2021.12.31 දක්වා බදුකරුවන්ගේ බදු දිනය පදනම්ව බදු ලෙජරයේ තක්සේරු හා සේවා ගාස්තුව ද බදු මුදලට අදාළව ලැබිය යුතු බවට ලෙජරයට පෙන්නුම් කර ඇත. එහෙත් විගණන අංශය මඟින්ද පෙන්වා දුන් උපදෙස් ප්‍රකාරව ගිණුම් වර්ෂයට අදාළ කාලය පදනම්ව සහ බදු, අධිහාර හා තක්සේරු හා සේවා ගාස්තු වෙන වෙනම ඇතුළත්ව නිවැරදිව ලෙජරය සකස් කර ඇත.ඒ අනුව ඉදිරියේ දී මෙය නිවැරදි කිරීම් සටහන් කර ගන්නා ලදි.ලේඛනය අනුව දැනටමත් රු.418,475.00 කට අදාළ තක්සේරු හා සේවා ගාස්තු අයකර ඇත. | ගිණුම් කාල පරිච්ඡේදය පදනම්ව බදු, අධිහාර, තක්සේරු හා සේවා ගාස්තු වෙන වෙනමඉදිරිප ත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | 2005 ජූලි 06 දිනැති අංක 2005/07 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව,ඉඩම් බදු දීමෙන් ලැබිය යුතු බදු මුදල් නියමිත දිනට අයවූයේ නැති නම් එම මුදල අයවිය යුතු දිනයේ සිට මුදල අය වූ දිනය දක්වා කාලය ගණන් බලා සියයට 10 ක දඩ මුදලක් බදුකරුවන්ගෙන් අය කළ යුතු වුවද බදු ඉඩම් 31 ක් සඳහා එපරිද්දෙන් ලැබිය යුතු දඩ මුදල වූ රු.21,064,409 ක් සමාලෝචිත වර්ෂයේ දී ලැබිය යුතු ආදායම් ලෙස හඳුනා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම් හා ණයගැතියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් පෙන්නුම් කරන බව නිරීක්ෂණය විය. | බදුකරුවන් 31 දෙනාට අදාළ හිඟ බදු මුදලට අධිභාරය ගැළපීම් නොකිරීමට පොදුවේ පහත සඳහන් කරුණු බලපා ඇත.<br>• ඉඩම බදු පදනම මත පවරා දී බදු ගෙවන ලෙසට බදුකරු දැනුවත් කර ලෙජර් ගිණුම් වලට හිඟ බදු මුදල ගැළපීම් කර තිබුණ ද මුදල් නොගෙවූ නිසාවෙන් භුක්තිය භාරදී නොමැති වීම.<br>• හිඟ බදු මුදල වාරික ලෙස අය කරන බදුකරුවන් සිටීම.<br>• නීතිමය ක්‍රියාමාර්ගයන් මගින් ඊට අදාළ හිඟබදු මුදල් අයකරගැනීමට අදාළ බදුකරුවන් සිටීම.<br>• දීර්ඝ කාලයක් තිස්සේ විහාරස්ථානය විසින් භුක්ති විඳින ඉඩම විකිණීමෙන් පවරා දීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවධානය යොමු කිරීම.<br>• මුල් බදු දැන්වීම් ලිපිය බදුකරු වෙත 2022.12.31 දිනෙන් පසුව යොමු කර තිබීම.<br>• දින 15 ට අඩු කාලයක් ප්‍රමාද වී තිබූ බදුකරුවන් වෙතින් අධිභාර මුදල් අය නොකිරීම.<br>• සම්පූර්ණ ඉඩමම හෝ කොටසක් රජය මඟින් අත්පත් කර ගැනීමට කටයුතු කර තිබීම.<br>• ඉඩමට අදාළ තක්සේරුව හා බදු මුදල යන දෙකම 2022 වසරට අදාළව සිදු වී තිබීම.<br>ඉහත කරුණුවලට අදාළ බදු ගොනු සම්බන්ධයෙන් අධිභාර ගැළපීම් සිදු නොකරන ලද අතර අධිභාර ගැළපිය යුතු ගොනුවලට අදාළ දැනටමත් ලෙජර් ගිණුම්වලට ගැළපීම් සිදු කර බදුකරුවන්ද දැනුවත් කර ඇත. | ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ක) | කොමිෂන් සභාවේ ඉදිරියට ලැබුණු බදු කුලී පරීක්ෂා කිරීමේදී බදු ගැනුම්කරුවන් 12 දෙනෙකුට අදාළ රු. 7,840,369 ක වාර්ෂික බදු කුලී ආදායම දෙවතාවක් ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ බදු ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි. | ආදායම් අංශය මගින් බදුකරුවන්ට අදාළ ආරම්භක ශේෂය,වර්ෂය තුළ ලැබුණු මුදල, 2022.12.31 දිනට ලැබිය යුතු මුදල හා ඉදිරියට ලද මුදල් පිළිබඳ මුදල් අංශයේ ලේඛනය පදනම්ව අවසන් ගිණුම් වාර්තා තුළ ගැළපීම් සිදුකර ඇත.ඉදිරියට ලද බදු ලේඛනයේ 2022.01.01 දිනට ශේෂයෙන් ප්‍රවර්ථන වර්ෂයට අදාළවද බදු මුදල ගණනය කර බදු ආදායමට ගැළපීම මුදල් අංශය මඟින්ද සිදුකර ඇත. ඒ අනුව මෙම බදුකරුවන් 12 දෙනාට අදාළ බදු ආදායම දෙවතාවක් ගිණුම් ගත වි ඇත. මුදල් අංශය සහ අනෙකුත් අංශ අතර නිසි සම්බන්ධීකරණයක් නොමැති වීම ඉදිරියේ දී සිදු නොවන ආකාරයට අදාළ අංශ අතර සම්බන්ධීකරණය ඇති කිරිමට අධ්‍යක්ෂ ජනරාල්ට උපදෙස් ලබා දි ඇත. | බදු කුලී ආදායම දෙවතාවක් ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ග) | 2022 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ තක්සේරු ගාස්තු අත්තිකාරම් රු.48,330,211 ක ශේෂය තුළ සමාලෝචිත වර්ෂයේදී දෙල්ගොල්ල වත්ත ඉඩමට අදාළව ලැබුණු මුදල රු. 425,000 ක් හා කුරුණෑගල පන්ලියද්ද වත්තේ අක්කර 15 ක් ගුරුගම්මානයක් සඳහා තෝරාගත් කට්ටිකරුවන්ට විකිණීමෙන් පවරා දීම වෙනුවෙන් ලද මුදල් රු.4,873,000 ක් වශයෙන් එකතුව රු.5,298,000 ක වටිනාකම ආදායමක් ලෙස හඳුනා ගෙන නොතිබුණි. එම වටිනාකම වගකීමක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් ආදායම එම වටිනාකමෙන් අඩුවෙන්ද ජංගම වගකීම් එම අගයෙන්ම වැඩියෙන්ද පෙන්නුම් කරන බව නිරීක්ෂණය විය. | 2023 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදි නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ. | වගකීම් හා ආදායම නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඝ) | 2022 දෙසැම්බර් 27 වන දින කොමිෂන් සභාව විසින් ලංකා බැංකුවෙහි ප්‍රති මිලදී ගැනුම් (REPO) තැන්පතු වල ආයෝජනය කර තිබුණු රු.40,000,000 ක් සියයට 18 බැගින් වූ පොලී අනුපාතය යටතේ ආයෝජනය කර 2023 ජනවාරි 23 දින කල් පිරීමට නියමිතව තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දින 04 ක් සඳහා ලැබිය යුතු පොලී ආදායම රු. 79,121 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.454,945 ක් ලෙස ගිණුම් ගත කර තිබීම නිසා එම ආදායම රු.375,824 කින් වැඩියෙන් ගිණුම් ගත වී තිබුණි. | 2023 මූල්‍ය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේ දි නිවැරදි කිරිමට කටයුතු යොදා ඇත. | ලැබිය යුතු පොලී ආදායම නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ජ) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 272 කඩිගාව යාය 03 ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පොලොන්තලාව ගමේ පිහිටි ඉඩමෙහි පිඹුරු අංක 2396 හි කැබලි අංක 320,323,324,325,327,332 යන ඉඩම් උජේකැලේ - කඩිගාව පාලම ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 17 වගන්තිය යටතේ රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් ගෙන් ලැබුණු තීරණය අනුව කොමිෂන් සභාවට ලැබිය යුතු වන්දි මුදල රු.274,400 ක් බව 2021 පෙබරවාරි 17 | වන්දි මුදල වන රු.274,400/- ක මුදල අවසාන මූල්‍ය ප්‍රකාශන වල ලැබිය යුතු මුදලක් ලෙස සටහන් වී නොමැත. එය 2023 වර්ෂයට අදාළව නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වන දින දන්වා තිබුණි.සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම එම මුදල ලැබී නොතිබුණු අතර එම මුදල මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු මුදලක් ලෙස හඳුනා ගෙනද නොතිබුණි. | | |
| (ට) | 2022 මාර්තු 14 වන දින අපහරණය කර තිබුණු පිරිවැය රු.452,000 ක් සහ ධාරණ අගය රු.162,979 ක් වූ ඡායා පිටපත් යන්ත්‍ර 4 ක් සහ පරිලෝකන යන්ත්‍රයක් (Scanner) 2022 මූල්‍ය තත්ත්ව ප්‍රකාශන වලින් ඉවත්කර නොතිබුණි. | ඡායා පිටපත් යන්ත්‍ර 04 සහ පරිලෝකන යන්ත්‍රය මූල්‍ය තත්ව ප්‍රකාශය තුල “Disposal / Auction” යටතේ ඇතුළත් කර ඇතත් එය වැරදීමකින් මුදල් අංශය මගින් ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ ගණයට ඇතුළත් කර ඇත. නමුත් එම අගය යන්ත්‍රෝපකරණ ගණයට ඇතුළත් විය යුතු අගයකි. එම වරද 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරිමේදි නිවැරදි කරන බව දන්වා සිටිමි. | අපහරණය කළ වත්කම් ගිණුම් වලින් ඉවත් කළ යුතුය. |
| (ඩ) | කළුතර දිස්ත්‍රික්කයේ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටි ඉංගිරිය වත්ත ඉඩමෙන් අක්කර 04 රූඩ් 02 ක් පුද්ගලයෙකුට කොමිෂන් සභා පනතේ 22(1) (ආ) යටතේ 2004 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මෙම ඉඩමේ කළුගල් කඩා ඉවත්කර විකිණීමට බදු දී ඇති අතර එම කාලය සඳහා වූ රාජ්‍ය භාගය භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයෙන් ලද තොරතුරු අනුව රු.3,921,410 ක් විය. බදු කරු විසින් 2022 දෙසැම්බර් 01 දින රු.850,000 ක මුදලක් ගෙවා ඇතත් නොගෙවූ රු.3,071,410 ක හිඟ බදු වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගෙන නොතිබුණි. එසේම 2023 මැයි 02 වන දින විගණනය වෙත ඉදිරිපත් කරන ලද බදු ලෙජරයෙහිද මෙම ලැබිය යුතු බදු ආදායම දක්වා නොතිබුණි. | මෙම ඉඩම් කොටස තුළ නිවසක් ඉදිකර ඇති බැවින් ඉදිරියට කැඩීමට ඇති කියුබ් ප්‍රමාණය ලබා ගැනීමට නැවත මැනුමක් කරන ලෙස 2017.10.25 දිනැතිව අධ්‍යක්ෂ මැනුම් විසින් අධ්‍යක්ෂ ව්‍යාපෘති වෙත වාර්තා කර තිබේ.ඒ අනුව මෙම ඉඩම නැවත මැනුමේදි පෙර පැවති ප්‍රමාණය වෙනස් වීම මත ඇති වූ ගැටළුකාරී තත්වය පිළිබඳ සොයා බැලීමට විධිමත්ව විමර්ශනයක් කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ විමර්ශන නිලධාරියෙකු වෙත 2023.07.12 දින භාරදී ඇත. ඒ අනුව මාස 02 ක් තුළ එකී විමර්ශන වාර්තාව ලැබුණු පසු මේ පිළිබඳව අවශ්‍ය කටයුතු සිදු කරන බව දැනුම් දෙමි. ගෙවිය යුතු මුදල පිළිබඳ 2022.05.23 දිනැතිව අධ්‍යක්ෂ ව්‍යාපෘති විසින්ද, 2022.06.30 දිනැතිව කළුතර දිස්ත්‍රික් අධ්‍යක්ෂක ද බදුකරු දැනුවත් කර ඇත. මෙම ගොනුව විමර්ෂණ තිබූ බැවින් බදු ලෙජරය සකස් කිරීම සඳහා ආදායම් අංශය වෙත නොතිබූ අතර දැනට එම ලෙජරය ආදායම් අංශය මගින් සකස්කර ඇත. 2023.07.10 දිනැතිව බදු ගෙවන ලෙසට බදුකරු දැනුවත් කර ඇත. | ලැබිය යුතු හා හිඟ බදු මුදල් ලේඛන වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ණ) | 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 44 (ඕ) වගන්තියේ දැක්වෙන කොමිෂන් සභාව විසින් සේවයෙහි යොදවා ගෙන සිටින තැනැත්තන් සඳහා අර්ථ සාධක අරමුදලක් පිහිටුවීම හා සුභසාධන හා විනෝද ක්‍රීඩා පහසුකම් සහ නිවාස හා නේවාසිකාගාර හා වෙනත් ඉඩකඩ සැපයීම සිදුකළ යුතුය යන්න වරදවා නිර්වචනය කර ගනිමින් කොමිෂන් සභාවේ වසර 5ක අඛණ්ඩ සේවයක් හිමි සේවකයින් හට පර්චස් එකක් | 44 (ඕ) වගන්තිය ප්‍රකාරව යමින් වර්තමානයේදි පමණක් නොව 1982-1984 කාලවකවනු වලදි ද සේවක පදනම මත ඉඩම් කොටස් ලබාදිම සිදුකර ඇති අතර එම කාලවකවානුවේදි ප්‍රදේශයෙන් ප්‍රදේශයට ඉඩම් කොටස් ලබාදීම පර්:10 හෝ 20 ඉක්මවන පරිදි වූ ප්‍රමාණයන්ගෙන් ඉඩම් ලබාදිම සිදුකර ඇති බව ලේඛන වල සඳහන්ව පවති.කොමිෂන් සභාව විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීන්දු තිරණ ප්‍රකාරව යමින් මේ වනවිටත් ක්‍රියාත්මක සේවකයින්ට ඉඩම් කොටස් ලබාදිමේ වැඩපිළිවල යටතේ විවිධ ප්‍රදේශවලින් ඉඩම් කොටස් හඳුනා ගැනිමෙන් පසුව සේවක පදනම මත | නීතියානුකූල නොවූ මෙම ඉඩම් බෙදාදීම වහාම නතර කළ යුතුය. බෙදා දුන් ඉඩම් ආපසු පවරා ගැනීම හෝ ඒවායේ වටිනාකම අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.1,000 ක වටිනාකමට පර් 20 බැගින් 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නිලධාරීන් 373 ක් වෙත ඉඩම් අක්කර 46 රූඩ් 1 පර්චස් 5.64 ක් ලබා දී තිබුණු බව නිරීක්ෂණය විය. | ලබාදීමට කටයුතු කර ඇති බවද සඳහන් කරමි. | |
| (ත) | නිලධාරීන්ට නිවසක් තනා ගැනීමට ඉඩමක් නොමැති වීම යන්න පදනම්ව කොමිෂන් සභාවේ ඉඩම් ඉහත (ණ) නිරීක්ෂණය පරිදි අදාළ නිලධාරීන්ට විකිණීමෙන් බැහැර කර ඇතත්, විගණනය විසින් සිදු කරන ලද නියැදි පරීක්ෂණයේදී නිරීක්ෂණය වූයේ ඇතැම් නිලධාරීන් වෙත ඉඩම් ලබා දී පසුව වසර 03 - 04 ක් පමණ කාලයක් ගත වූ පසුව නැවත එම ඉඩම කොමිෂන් සභාව වෙත පවරා වෙනත් ස්ථානයකින් ඉඩමක් ලබා ගැනීම සිදු කර තිබුණු අතර මෙලෙස නිලධාරීන් විටින් විට ඉඩම් මාරු කර ඇති බවත් කොමිෂන් සභාව විසින් නිලධාරීන්ගේ ඉල්ලීම් පදනම් කර ගනිමින් මෙලෙස ඉඩම් මාරු කර ඇති බවත් නිරීක්ෂණය විය. | ඉදිරියේදි යම් සේවකයකු තම ඉඩම් කොටසට ඔප්පුව ලබා ගැනිමට ප්‍රථමව අදාළ ඉඩම් කොටස නිරීක්ෂණය කර කිසිදු ගැටලුකාරි තත්ත්වයක් නොමැති බවට දන්වමින් ඉඩම් කොටසට අදාළ ඔප්පුව ලබා ගැනිමට එකඟ වන බවට දිවුරුම් ප්‍රකාශයක් ලබාදිමෙන් පසුව ඔප්පුව ලබාදිමට කටයුතු කරනු ලබන බවටත්, නැවත හුවමාරු නොකරන බවටත් සියලු කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත.තවද අංක 2/1/145(IV) හා 2023.05.24 දිනැති මාගේ අභ්‍යන්තර මාර්ගෝපදේශයක් මඟින් සේවකයින්ට ඉඩම් ලබාදීමේ ක්‍රමවේදය විධිමත් කිරීමට කටයුතු යොදා ඇත. | සාවද්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඉඩම් ලබාගත් නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත යුතුය. |
| (ද) | 2005 අගෝස්තු 15 දිනැති අංක 5930 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පත්‍රිකාව සඳහා ගෙන ඇති තීරණය අනුව කොමිෂන් සභාව විසින් සේවකයන්ට ඉඩම් ලබා දීමේදී ස්වාමි පුරුෂයාට හෝ භාර්යාවට නිවසක් තනා ගැනීමට ඉඩමක් නොමැති බවට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු බවට තීරණය කර තිබුණි. කෙසේ නමුත් විගණනය විසින් කෑගල්ල දිස්ත්‍රික්කයේ වල්කොටුව වත්ත, මාතලේ දිස්ත්‍රික්කයේ වරකන්ද වත්ත, ගාල්ල දිස්ත්‍රික්කයේ වහලන්දූව වත්ත නැමති ඉඩම් මගින් සේවකයන්ට ඉඩම් කොටස් ලබා දීමට අදාළ පවත්වා ගෙන යනු ලබන ගොනු පරීක්ෂා කළ ද මෙලෙස දිවුරුම් ප්‍රකාශ ලබා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ස්වාමිපුරුෂයා හා භාර්යාව යන දෙදෙනාම මෙම කොමිෂන් සභාවේ සේවකයින් වශයෙන් සේවය කිරිමට නොහැකි බවට පූර්ව කොන්දේසියක් පනවා නොමැති විමත් පෞද්ගලික ජිවිතයේදි ස්වාමිපුරුෂයා හා භාර්යාව වුවද සේවය කිරිමේදි ඔවුන් වෙන් වෙන් වශයෙන් සේවකයින් දෙදෙනෙකු ලෙස සලකන බැවින්ද යන කරුණු 2018.02.27 දින පැවැති කොමිෂන් සභා වාරය වෙත කරුණු වාර්තා කිරිමෙන් පසුව සේවක පදනම මත ස්වාමි පුරුෂයා හා භාර්යාව යන දෙදෙනාම එක් අයකු ලෙස නොසලකා දෙදෙනාටම ඉඩම් කොටස ලබාදිම අනුමත කර ඇත.සේවක පදනම මත ඉඩම් කොටස් ලබාදීමේදි මුල් අවස්ථාවේදි ඉඩම් කොටස් ලබා ගැනිම සඳහා දිවුරුම් ප්‍රකාශ ලබා ගැනිම සිදු කළද පසුකාලිනව එසේ ලබා ගැනිම සිදු වි නොමැති බව නිරීක්ෂණය කරමි. | මෙම ඉඩම් අවභාවිතය පිළිබඳ පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු සියලු දෙනාට එරෙහිව විනය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (න) | 2022 වර්ෂයේ දැනට ශේෂව පවතින වන්දි ගෙවා අවසන් නොකළ ගොනු 25 ක කටයුතු අවසන් කිරීමට සැලසුම් කර ගොනු 13 ක් පමණක් නිම කර ඇතත් ඒ සඳහා ගෙවිය යුතු වන්දි ගණනය කර ගිණුම් වල හෙළිදරව් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රකාශිතව පැවරී ඇති වන්දි මුදල් ගෙවා අවසන් නොකළ ගොනු 25 ක් තක්සේරු හා වන්දි අංශය මගින් හඳුනාගෙන ඒවායේ කටයුතු 2022 අවසන් කිරීමට ඉලක්ක කර ඇත. එම ගොනු අතරින් වර්ෂය තුළදී ගොනු 04 ක වැඩ අවසන් කර ඉතිරි ගොනු සම්බන්ධව දැනට කටයුතු කරමින් පවතී.රජයේ ප්‍රධාන තක්සේරුකරු වෙතින් වන්දි නිශ්චය කැඳවා ඇති බවත් වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වී ඇති බවත් තක්සේරු හා වන්දි අංශ අධ්‍යක්ෂ විසින් සඳහන් කර ඇත. | ගෙවිය යුතු වන්දි මුදල් නියමිත පරිදි ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ප) | වන්දි හා පොලිය ගෙවිය යුතු 31 දෙනෙකු හඳුනා ගෙන ඔවුන්ගෙන් 10 දෙනෙකුට ගෙවිය යුතු මුදල් උසාවියේ තැන්පත් කිරීමට සැලසුම් කර තිබුණද ඔවුන්ට ගෙවිය යුතු මුදල් සම්බන්ධයෙන් ගිණුම් වල හෙළිදරව් කර නොතිබුණි. | කොමිෂන් සභාව සතු වූ ඉඩම් සඳහා වන්දි හා පොලී මුදල් ලබා ගැනීමට ප්‍රකාශකයින් ඉදිරිපත් නොවූ ගොනු 31 ක් ලෙස හඳුනාගෙන තිබුණි.ඒවාට අදාළ වන්දි මුදල් 2022 වර්ෂයේ උසාවියේ තැන්පත් කිරීමට සැලසුම් කර තිබුණද,ගොනු 10 ක වන්දි මුදල් සඳහා වවුචර් සකස් කර නීති අංශය වෙත යොමු කර ඇත. ඉතිරි ගොනු වල කටයුතු 2023 වසරේදී නිම කිරීමට කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ තක්සේරු වෙත උපදෙස් ලබාදෙන ලදී. | ගෙවිය යුතු වන්දි ගෙවීමට කටයුතු කළ යුතුය. |

**1.5.4 විගණනයසඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.2,732,617,321 ක් වටිනා ලැබිය යුතු කළුගල් බදු, ඉඩම් බදු, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ 37 ක සහ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ 14 ක නිවැරදිතාවය තහවුරු කිරීම සඳහා ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ණයගැති හා ණය හිමි ශේෂ සනාථ කර ගැනිම සඳහා ණයගැති ශේෂයන් වන ඉඩම්අමාත්‍යාංශය,හඳබිමඅධිකාරිය,ජනතාවතු සංවර්ධන මණ්ඩලයට හා ණයහිමි ශේෂයන් වන මහවැලි අධිකාරිය, ඇටර්නිජනරාල්දෙපාර්තමේන්තුවවෙත මුදල් අංශය මඟින් ලිපි යොමු කර ඇති අතර එහි පිටපත් ජාතික විගණන කාර්යාලය වෙත යොමු කර ඇත. මෙහි සඳහන් මැතිවරණ කොට්ඨාශ ඉඩම් ප්‍රතිසංස්කරණ සමුපකාර සමිති සියල්ලම පාහේ ඈවර කර ඇති අතර, විවිධ සේවා සමුපකාර සමිති පැවතිද එම ණයගැති හා ණයහිමි ශේෂයන් පිළිබඳ තොරතුරු ලබා ගැනිම සඳහා සමුපකාර සංවර්ධන කොමසාරිස් වෙත 2023.06.20 දිනැතිව ලිපිය යොමු කිරිමට කටයුතු කර ඇත. | වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ගිණුම් වලට හාවෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ගිණුම් වලට අදාළ ශේෂ සනාථනයන් ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.3,561,131,052 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයෙහි ඇතුළත් විවිධ සේවා සමුපකාර සමිතිය,හදබිම අධිකාරීය, ජනතා වතු සංවර්ධන මණ්ඩලය වැනි රාජ්‍ය ආයතන 03 කින් ලැබිය යුතු වර්ෂ 30 ඉක්ම වූ රු.2,126,952,139 ක් සහ වර්ෂ 10 ඉක්ම වූ රු.219,681,524 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ආයතන 04 සමඟ සාකච්ඡා කර නිවැරදි විසඳුමක් ලැබී නොමැත.මේ වන විට එම ආයතන වලින් ලැබියයුතු ලෙස දක්වා ඇති වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් 2023/05/25 දිනැතිව සංචාරක සහ ඉඩම් අමාත්‍යාංශයට මුලික කෙටුම්පතක් ඉදිරිපත් කර ඇත. | ශේෂ නොපමාව නිරවුල් කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන වල විවිධ ණයගැතියන් යටතේ පෙන්නුම් කරන කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්ක දෙකෙහි පිහිටි ඉඩම් කැබලි 08 ක් බදුගත් පුද්ගලයින්ගෙන් අයවිය යුතු රු.2,311,017 ක් වර්ෂ 23 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණද, අදාළ බදු මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | කළුතර දිස්ත්‍රික්කයේ බරෝඩේල් වත්තේ අංක 7/1997 පිඹුරේ කැබලි අංක 07 කොටස කේ.ඒ.වසන්ත නමැත්තාමුදල් ගෙවා ඔප්පුව ලබාදී ඇත.බරෝඩේල් වත්තේ එම්.ඩී.එස්. ප්‍රියන්ත යනුවෙන් නමක් පිඹුරුපතේ සඳහන්ව නැත.ඉලිඹ වත්ත - පී. තිලකසිරි සහ ඩී.ආර්. හේමලතා ස්වාමියා සහ බිරිඳ වේ. අදාළ මුදල් ගෙවීමෙන් පසු ඔවුන් වෙත ඔප්පුව ලබාදී ඇත.ඉලිඹ වත්ත - එම්.එස්.ඩී. සේනාධිර යන අය පිළිබඳ කිසිදු තොරතුරක් ගොනුවල සඳහන් නොවේ.මිල්ලෑව වත්ත - කේ.ඒ. පාලිත යන අයට අදාළ මුදල් ගෙවන ලෙස  දැනුවත් කර ඇතත්,ගෙවීම් කිරීමට අපහසු බව දන්වා ඇත.ගම්පහ දිස්ත්‍රික්කයේ කහටගහ වත්ත නැමති ඉඩමේ පී.එල්. සරත්චන්ද්‍රනැමැති අයෙකු එම ප්‍රදේශයේ නොමැති බවට අදාළ ග්‍රාමනිලධාරි මගින් තහවුරු කරගෙන ඇත.පාලු වත්ත ඉඩමේ එම්.ඩී. මේරි බෙන්ටා යන අයගේ රු.112,322ක් අය කර ගෙන ඔප්පුව ලබා දී ඇත.දැනට මුදල් අයකර ඔප්පු ලබා දී ඇති කට්ටිකරුවන් පිළිබඳ කොමිෂන් සභාව වෙත වාර්තා කර 2023 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරන අතර අනෙකුත් අය පිළිබඳව ඉහත සඳහන් කළ පරිදි කටයුතු කරන බව දන්වා සිටිමි. | හිඟ බදු මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.11,362,992 ක් වූ ඉඩම් විකුණුම් අත්තිකාරම් ශේෂයෙහි වර්ෂ 10 | ගිණුම්ගත වී ඇති මෙම ඉඩම් විකුණුම් අත්තිකාරම් වැඩි වශයෙන් 2002-2004 කාලය තුළ සිදුකරන ලද ගනුදෙනුවේ. එකී ඉඩම් ගනුදෙනු සම්බන්ධයෙන් | විකුණුම් අත්තිකාරම් ශේෂ |

| | | | |
|---|---|---|---|
| | කට වැඩි එකතුව රු.11,222,992 ක ශේෂ ඇතුළත්ව තිබුණු මුත් ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විටත් අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍යමණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.ඒ සඳහා අනුමතිය ලද පසුව මෙකී නිරවුල් නොවූ අත්තිකාරම් ගනුදෙනු නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | නොපමාව නිරවුල් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.14,080,850 ක් වූ ඉඩම් බදුකුලී අත්තිකාරම් ගිණුම් ශේෂයේ ඇතුළත් පුද්ගලයින් 269 දෙනෙකුගෙන් ලබාගත් රු.11,215,850 ක අත්තිකාරම් මුදල් වර්ෂ 17 කට වැඩි කාලයක සිට රඳවාගෙන තිබුණ ද, අදාළ ඉඩම් නීත්‍යානුකූලව බදු දීමට හෝ අත්තිකාරම් නැවත පියවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | 2002 – 2004 කාලය තුළ පවරන ලද ඉඩම් 219 ක අක්. 11942 කින් දැනට සරුසාරව වගා කර ඇති ඉඩම් අක්. 1156 ක් විමර්ශන නිලධාරීන් මගින් ක්ෂේත්‍ර පරික්ෂා කර කරුණු තහවුරු කරගෙන ඇත. 2022.02.17 දිනැති අංක 11738 කොමිෂන් තීරණය මත අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා කෙටුම්පත් කරන ලද කැබිනට් පත්‍රිකාව 2022.04.20 දින ඉඩම් අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.අනතුරුව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර අදාළ බදුකරුවන් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය වෙත කැඳවා සාකච්ඡා කරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද පසු ඉදිරි කටයුතු කිරීමට නියමිතය. | ඉඩම්බදු අත්තිකාරම් නොපමාව පියවිය යුතුය. |
| (ඇ) | 2022 මූල්‍ය ප්‍රකාශන හි වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ පෙන්නුම් කරනු ලබන තක්සේරු ගාස්තු අත්තිකාරම් මුදල රු.48,330,211 ක් වූ අතර එහි ආරම්භක ශේෂය ලෙස පෙන්නුම් කරනු ලබන රු.40,633,774 ක වටිනාකම වසර 02 ත් 05 ත් අතර කාලයක සිට නිරවුල් නොවී පවතින බව නිරීක්ෂණය විය. | තක්සේරු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු යම් හිඟ තක්සේරු ගාස්තුවක් පවතීද යන්න පිළිබඳව විමසා 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිරවුල් කිරීමට කටයුතු කරනු ලබයි. | නොපමාව නිරවුල් කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | ආයතනයේ අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීමට පෙර අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය සහ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගත යුතු වුව ද, සමාලෝචිත වර්ෂය තුළ සිදු කළ රු. 3,564,384,482 ක ආයෝජන සඳහා අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අනුමැතිය ඉල්ලා 2022.04.05 දිනැතිව මුදල් අමාත්‍යාංශය වෙත ලිපි යොමු කර ඇතත් මේ වන තෙක් පිළිතුරු ලැබී නොමැත. | ආයෝජනය කිරීමේදී මුදල් පනතේ විධිවිධාන පරිදි ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තිය | කොමිෂන් සභාව ආරම්භයේ සිට දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් බදු සඳහා ලියාපදිංචි වී නොතිබූ අතර, එම පනතේ තුන්වන උපලේඛනයේ සඳහන් ආයතන | 1972 වර්ෂයේ සිට මේ දක්වා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ආදායම් බදු සඳහා ලියාපදිංචි | දේශීය ආදායම් පනත ප්‍රකාරව බදු නිදහස් සහතිකයක් ලබා ගැනීමට කටයුතු කළ |

| | | | | |
|---|---|---|---|---|
| | | පමණක් එම අවශ්‍යතාවයෙන් නිදහස් ලෙස සලකා බදු ගෙවීමෙන් නිදහස් කර තිබුණි. කොමිෂන් සභාව එහි සඳහන් ආයතනයක් නොවන නමුත් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | වීමක් හෝ කිසිදු ආදායම් බදු ගෙවීමක් මේ දක්වා සිදුකර නොමැති බැවින් ආදායම් බදු නිදහස් ආයතනයක් සේ සලකා කටයුතු කර ඇත. | යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) | II පරිච්ඡේදයේ 13.3 ඡේදය | වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වුවද, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (ඉඩම්) සහ අධ්‍යක්ෂ (පාලන හා ලේකම්) යන තනතුරු තුන සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් 2021 වර්ෂයේ පත්කර තිබුණු අතර 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ස්ථිර පදනම මත අදාළ තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ පාලන යන බඳවාගැනීම් සඳහා 2023.01.16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අනුමැතිය ලැබී ඇත. අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා බඳවාගැනීමට ප්‍රසිද්ධ දැන්වීම් පළකර 2023.07.11 දින සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. එම ලිපිය මඟින් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ස්වාධීනව කටයුතු කළ යුතු බැවින් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් හෝ වෙනත් කාර්යයක නිරතවන නිලධාරියෙකු අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස පත්කිරීම සුදුසු නොවන බවට දක්වා ඇති අතර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විෂය පථය අනුව අධ්‍යක්ෂ ලේකම්ගේ කාර්යය ඉටු කිරීම සඳහා පිරිවැය ප්‍රතිලාභ සැලකිල්ලට ගනිමින් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් වෘත්තීය ආයතනයක සේවාව ලබාගැනීම සුදුසු බවට නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. එබැවින් ලේකම්, අධ්‍යක්ෂ පාලන තනතුර, ලේකම් හා අධ්‍යක්ෂ පාලන වශයෙන් තනතුරු දෙකක් ලෙස වෙන්කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ | නොපමාව පුරප්පාඩු පිරවිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අනුමැතියට 2023.05.15 දිනැති ලිපිය යොමු කර ඇත. ඒ සඳහා, අනුමැතිය ලැබුණු පසු එම බඳවාගැනීම් වෙන් වෙන් වශයෙන් සිදු කිරීමට නියමිතය. | |
| (ii) | V වැනි පරිච්ඡේදයේ 1.1 ඡේදය | රාජ්‍ය සේවයේ තනතුරක් දරන යම් නිලධාරියෙක් රාජ්‍ය සේවයේ වෙනත් තනතුරක සේවය භාරගැනීම සඳහා තමා දරන තනතුරෙන් මුදවා ගත යුතු වුවද, එසේ නොමැතිව එක් නිලධාරියකු 2020 ඔක්තෝම්බර් 23 දින සිට 2022 මාර්තු 31 දින දක්වා කොමිෂන් සභාවේ ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරේ සේවය කරමින් සිටියදී, 2021 ජනවාරි 01 දින සිට මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුර සඳහා වසරක පරිවාස කාලයකට යටත්ව ස්ථිර පදනම මත සේවයට බැඳී තිබුණි. එකම කාලය තුළ ආයතන 02 න් වැටුප් හා දීමනා ලබාගෙන තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව විසින් අදාළ නිලධාරියාගේ පැමිණීම සහ ලබාදෙන සේවය පිළිබඳව සැලකිලිමත් නොවී වැටුප් හා දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට රු. 2,038,979 ක මුදලක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. | මෙම ආයතනයේ ව්‍යාපෘති හා විමර්ශන අධ්‍යක්ෂ තනතුරුට අමතරව මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමේ නියෝජ්‍ය සමාන්‍යාධිකාරී පාලන ස්ථිර තනතුර මත සේවයට බැඳී තිබුණු බව අනාවරණය විය.ඒ අනුව,2022.10.27 දිනැති ලිපිය මඟින් මහ නැඟුම යන්ත්‍රෝපකරණ සමාගමේ සාමාන්‍යාධිකාරී වෙතින් 2020.10.29 දින සිට 2022 මාර්තු මස දක්වා කාලය තුළ එම ආයතනයේ නීතිඥ පි.ඒ.හසිත කුමාර මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) ලෙස සේවය කළ බවත්, වැටුප් ගෙවා ඇති බවත්, 2022.11.03 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත. කෙසේ වෙතත් විගණන විමසුම මගින් පෙන්වා දී ඇති පරිදි කොමිෂන් සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටියදී ඉහත ආයතනයේ සේවයට බැඳී ඇති අතර ඒ බව සභාව දැනුවත් කර නොතිබුණි.මෙම පත්කිරීම ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 47 (3) වගන්තිය ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයාපත්කර මා විසින් රාජකාරි පැවරුම් සිදුකර ඇත. තවද මාගේ අධීක්ෂණය යටතේ රාජකාරී කටයුතු සිදුකර ඇත. | වැඩිපුර ගෙවූ වැටුප් සහ දීමනා ආපසු අයකර ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදීජනජයේ මුදල්රෙගුලාසි සංග්‍රහයමු.රෙ.1645 (අ) | කොමිෂන් සභාව සතු වාහන 13 ක වාහන ලොග් පොත් නිසියාකාරව යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | කොමිෂන් සභාවේ පවතින වාහන ලොග් පොත් 2020 වර්ෂයේ සිට යාවත්කාලීන කර නොමැත. ගෙවීම් සහ පරිපාලන කටයුතුවල පහසුව සඳහා වෙනම රෙජිස්ටරයක් පාලන අංශය මගින් පවත්වාගෙන යන අතර, එම තොරතුරු පසුව එක් එක් වාහනයට අදාළ ලොග් පොතට ඇතුළත් කරන බවට දැනුම් දී ඇත. ඒ අනුව එම සියලුම තොරතුරු මසක් ඇතුළත නිවැරදිව අදාළ ලොග් පොත්වලට ඇතුළත් කරන ලෙස පාලන අංශය වෙත උපදෙස් ලබාදී ඇත. | වාහන ලොග් පොත් නිසියාකාරව යාවත්කාලීන කළ යුතුය. |
| (ඉ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 ජේදය | රැඳවුම් මුදල් දෝෂ වගකීම් කාලපරිච්ඡේදය සාර්ථකව සම්පූර්ණ කළ පසු හෝ වැඩ සම්පූර්ණයෙන්ම අවසන් කළ පසු කොන්දේසි රහිත සහ අවලංගු කළ නොහැකි සුරක්ෂණයක් මත මුදා හැරිය යුතු වුවද, රු. 73,247 ක් වූ සියයට 10 ක රැඳවුම් මුදල් දෝෂ වගකීම් කාලපරිච්ඡේදය සම්පූර්ණ නොකොට සහ ගොඩනැගිලි අලුත්වැඩියාව අවසාන වීමෙන් පසු අවලංගු කළ නොහැකි සුරක්ෂණයක් ද ලබා නොගෙන එම මුදල ගෙවා ඇති බව විගණනයට නිරීක්ෂණය විය. | මොණරාගල දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියාව මොණරාගල ප්‍රාදේශීය ලේකම්ගේ අධීක්ෂණය යටතේ සිදුකර ඇති බව එම මොණරාගල දිස්ත්‍රික් අධ්‍යක්ෂ වෙතින් සහ ප්‍රාදේශීය ලේකම් වෙතින් ලිඛිතව තහවුරු කර ගැනීමෙන් අනතුරුව, ප්‍රාදේශීය ලේකම් විසින් ඉදිරිපත් කරන ලද වවුචර්පත සඳහා ගෙවීම් සිදුකර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.518,199,960 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 310,284,854 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 207,915,106 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ඉඩම් අත්පත්කර ගැනීම්, ඉඩම් විකුණුම් හා ඉඩම් බදුදීම් ආදායම් පිළිවෙලින් රු.119,884,134, රු,136,271,322, රු.51,395,803 කින් වැඩිවීම සහ මූල්‍ය ආදායම් රු.54,214,914 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඉඩම් විකුණුම් ආදායම, ඉඩම් බදුකුලී ආදායම සහ ස්ථාවර තැන්පතු පොලී ආදායම සියයට 65, 24 සහ 46 ක අගයන්ගෙන් වැඩිවන විට

ඉඩම් පරිහරණ ගාස්තු සහ කළුගල් බදුකුලී ආදායම් සියයට 71 ක සහ සියයට 160 ක අගයන්ගෙන් අඩුවී තිබුණි.

(ආ) පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වියදම, වාහන අලුත්වැඩියා වියදම, ප්‍රවාහන දීමනා, වාහන කුලී වියදම් සියයට 7 සිට සියයට 88 දක්වා පරාසයකින් අඩු වී තිබුණද ඉන්ධන දීමනා හා නීති වියදම් පිළිවෙලින් සියයට 31 කින් සහ සියයට 50 කින් වැඩිවී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 23 : 1 ක් වූ අතර 2021 වර්ෂයේ එම අනුපාතය 29 : 1 ක් විය. ඒ අනුව ජංගම අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව පහළ අගයකින් පවත්වාගෙන ගොස් තිබුණද කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වලට වැඩියෙන් ජංගම වත්කම් වල මුදල් ආයෝජනය කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) 2021 වර්ෂයේ සියයට 11 ක් ව පැවති තෝලන අනුපාතය සමාලෝචිත වර්ෂයේදී ද එම අගයම පවත්වා ගෙන ගොස් තිබුණද, කොමිෂන් සභාව විසින් මුලු වගකීම් පියවීමට අවශ්‍ය ප්‍රමාණයට වැඩි හිමිකම් ප්‍රාග්ධනයක් පවත්වාගෙන ගොස් ඇති බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ අංක 11120 දරන 2020 ජුලි 22 දිනැති කොමිෂන් සභා පත්‍රයට අදාළ තීරණය මගින් ඉඩම් ලේඛනය පිළියෙල කිරීමේ අවශ්‍යතාවය මත පදනම්ව මාස 03 ක කාලයක් සඳහා කුලී පදනම මත මෝටර් රථ 10 ක් ලබා ගැනීම වෙනුවෙන් 2021 අප්‍රේල් මස සිට 2022 නොවැම්බර් දක්වා කාලයට රු.21,573,583 ක වියදමක් දරා තිබුණද ඉඩම් ලේඛනය පිළියෙල කිරීමේ ප්‍රගතියක් නොතිබුණි. | කොමිෂන් සභාවේ ඉඩම් ලේඛනය සකස් කිරීමේ කටයුතු සඳහා කැබ් රථ 10 ක් ගිවිසුම් ගත මාස 03 ක කාලසීමාවක සඳහා ලබා ගෙන ඇත.2021 කොවිඩ් 19 වසංගත තත්ත්වය 2022 වර්ෂයේ මුල් භාගය දක්වාම පැවතීමත්,සභාවේ නිලධාරීන් මෙම වසංගතයට ගොදුරු වීම හේතුවෙන්ක්ෂේත්‍රයට ගොස් මහජනතාව හමුවී තොරතුරු රැස්කිරීමේ කටයුතු නිසි පරිදි සිදුකිරීමට බාධා විය. එමෙන්ම, මෙම කාලසීමාව තුළ එවකට පැවැති රජය මගින් කාබනික පොහොර භාවිතා කිරීම යන රාජ්‍ය ප්‍රතිපත්තිය මත කොමිෂන් සභාව විසින් උතුරු මැද පළාතේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් කාබනික පොහොර නිෂ්පාදන නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සිදුවිය.උතුරු මැද පළාත ආශ්‍රිතව ක්‍රියාත්මක වූ කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීමේ රාජකාරි සඳහා යොදවා තිබුණු අතර, මෙම වාහන එම කාල පරිච්ජේදයේදී අනුරාධපුර දිස්ත්‍රික්කය ආශ්‍රිතව ඉඩම් ලේඛනය සකස් කිරීම සඳහා යොදා ගැනීමක් සිදුකර නොමැත., එම රථ ධාවනයේ නොයෙදුනද, කුලී පදනම මත ලබාගත් වාහන සඳහා වන මාසික බදුකුලිය ගෙවීම් කිරීම සිදුකළ යුතුව තිබුණි. එම කැබ් රථ | අනාර්ථික වියදම් වලක්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අතරින් කිහිපයක් හෝ කාබනික පොහොර ව්‍යාපෘතිය සඳහා අනුයුක්ත කිරීම හා එම කුලිය කාබනික පොහොර ව්‍යාපෘතිය තුළින් අයකර ගැනීම ආර්ථික වශයෙන් ඵලදායීවූ බවද නිරීක්ෂණය කරමි. | |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දකුණු පළාත් තරුණ සේවා මධ්‍යස්ථානයක් හා ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීමට දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ලබාගත් බද්දේගම මාකුරුගොඩ වත්තේ පිඹුරු අංක 3532 කැබලි අංක 01 යටතේ අක්කර 16 ක ඉඩම සඳහා වන්දි මුදල රු.31,500,000ක් ලෙස 2012 අගෝස්තු 08 දින බද්දේගම ප්‍රාදේශීය ලේකම් විසින් කොමිෂන් සභාවට දන්වා තිබුණි. එසේම රු.72,413,609 ක් වැය කර අදාළ ඉදිකිරීම් කටයුතු සිදු කර ඇති බව දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් 2018 මැයි 10 දිනැති අංක CSS/4/6/1/198 දරන ලිපිය මගින් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත කොමිෂන් සභාවේ සභාපතිටද පිටපතක් සහිතව යොමු කර ඇත. ඒ අනුව මෙම ඉඩමට අදාළ වන්දි මුදල පිළිබඳ තීරණය 2012 වර්ෂයේදී ලැබී 2022 දෙසැම්බර් 31 දිනට වසර 10 ක් ගත වුවත් 2012 වර්ෂයට අදාළ එම වන්දි මුදල සදොස් ලෙස සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | වන්දි මුදල වූ රු. 31,500,000 ක මුදල මේ දක්වා ගෙවා නොමැත.දිස්ත්‍රික් කාර්යාලය මඟින් විටින් විට විමසීම සිදු කරනු ලැබුවද ඔවුන් වෙත රු. 800,000 ක මුදලක් තැන්පත් කර ඇති බවත් ඉතිරි මුදල මේ දක්වා ලබා දී නොමැති බවත් දන්වන ලදි. ඒ අනුව ඉහත අගය මූල්‍ය ප්‍රකාශන වල ණය ගැති ශේෂයේ ඉදිරියටත් පවත්වාගෙන යාමට සිදු වී තිබේ. | වන්දි මුදල් අයකර ගැනීමට හා ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට ඉඩම් බදු දී ඇති බදුකරුවන් 530 දෙනෙකුගෙන් 152 ක් එනම් සියයට 28 ක් සඳහා පමණක් බදු ගිවිසුම් ලබා දී තිබුණු අතර බදුකරුවන් 378 ක් සමඟ නීත්‍යානුකූල ගිවිසුම් අත්සන් කර නොමැති බව නිරීක්ෂණය විය. | බදු පදනම මත බැහැර කර ඇති ඉඩම් සඳහා දීර්ඝකාලීන බදු ගිවිසුමක් ලබා දෙනු ලැබේ. දීර්ඝ කාලයක් සිට භුක්ති විඳින බදු මුදල් ද ගෙවන බදුකරුවන්ට අදාළ ව්‍යාපෘති කමිටු අනුමැතිය,කොමිෂන් සභා අනුමැතිය,ගරුවිෂයභාර ඇමතිතුමාගේ අනුමැතිය, කැබිනට් අනුමැතිය නොමැති ගොනු දක්නට ලැබීම සහ මුල් වසර 05 ට අදාළ බදු මුදල් ගෙවා ඇති එහෙත් බදුකරුවන් බදු ගිවිසුම නොලැබීම මත වර්තමාන බදු නොගෙවා සිටින බදුකරුවන් සිටීම වැනි කරුණු හේතුවෙන් බදු ගිවිසුම් ලබා දීමට නොහැකි වී ඇත.මෙම බදු දීම් සඳහා දීර්ඝ කාලයක් ගත වී ඇති බැවින් වර්තමානයේ දී බදු දීමේ ක්‍රියාවලිය මුල සිට අනුගමනය කිරීම අපහසු කාර්යයක් බැවින් මේ සඳහා 784 වන කොමිෂන් සභා වාරය වෙත කොමිෂන් පත්‍රිකාවක් ඉදිරිපත් කළ | බදු දී ඇති ඉඩම් සඳහා නීත්‍යානුකූල ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අතර ඒ සඳහා 2023.02.02 දිනැතිව P-1150 දරන තීරණය ලැබී ඇත.නමුත් ඉහත තීරණය පරිදි බදු ගිවිසුම් ලබාදීමේදී සැලකිය යුතු ප්‍රගතියක් මේ වන තෙක් අත්කරගෙන නොමැති අතර 2023.07.13 දින පැවති කොමිෂන් සභාවේදී අභ්‍යන්තර නීතිඥවරුන්ට අමතරව බාහිර නීතිඥ මඩුල්ලක්ද මේ සඳහා පත්කර ඇති අතර ඒ අනුව ඉදිරි මාස 03 ක් ඇතුළත ඒ සම්බන්ධ ප්‍රගතිය ඔබ වෙත වාර්තා කරමි. | |
| (ඇ) | බදු පදනම මත ඉඩම් බැහැර කිරීම වෙනුවෙන් 2022 ජනවාරි 01 දිනට ලැබිය යුතු ශේෂය රු.620,015,611 ක් වූ අතර එම හිඟයෙන් සමාලෝචිත වර්ෂයේදී අයකරගත් වටිනාකම රු.101,609,039 ක් හෙවත් සියයට 16 ක තරම් අඩු ප්‍රමාණයක් විය. එමෙන්ම 2022 වර්ෂයට අදාළ ලැබිය යුතු ආදායම රු.243,225,922 කින් අයකරගත් වටිනාකම රු.71,140,458 ක් හෙවත් සියයට 29 ක් වී තිබුණි. ඒ අනුව ආදායම් එකතුකර ගැනීමේ අකාර්යක්ෂමතාවයක් පැවති බව විගණනයට නිරීක්ෂණය විය. | 2020 කොවිඩ් වසංගතය හා ආර්ථික උද්ධමනය බදුකරුවන් මෙන්ම, රසායනික පොහොර භාවිතය අඩුවීම තුළ කෘෂිකාර්මික කටයුතු කරගෙන යනු ලබන බදුකරුවන්ද දැඩි අපහසුතාවයකට පත්ව තිබීම. ඒ අනුව බදු මුදල් ගෙවීමට හැකියාව නොමැති බැවින් ඒ සඳහා සහන කාලයක් ලබා දෙන ලෙසට නිතර නිතර බදුකරුවන් වෙතින් ඉල්ලීම් කර ඇත.ඒ අනුව රටේ පවතින තත්ත්වයද කර්මාන්තකරුවන්ගේ අනාගත පැවැත්ම මෙන්ම කොමිෂන් සභාවේ ආදායමද වැඩිකර ගැනීම ඒකායන පරමාර්ථයෙන් වාර්ෂික බදු මුදල වාරික වශයෙන් හෝ අයකර ගැනීමටත්, දීර්ඝකාලයක සිට බදු නොගෙවා පැහැර හරින බදුකරුවන් සඳහා කඩිනමින් නීතිමය පියවර ගැනීමටත් කටයුතු කර ඇත. ඒ අනුව ඉදිරි වර්ෂ තුළ මෙම බදු අයකිරීම ඉහල ප්‍රතිශතයක් කරා රැගෙන යාමට අවස්ථාවක් ඇති බවත් දන්වමි. | කාර්යක්ෂමව බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2019 මැයි 22 දින කොමිෂන් සභාවට ඒකාබද්ධ ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් රු.8,500,000 කට මිලදී ගෙන තිබුණ ද, එම තොරතුරු පද්ධතිය මගින් ලැබිය යුතු ඉඩම් බදු මුදල් පිළිබඳ තොරතුරු ලබාගැනීමේ හැකියාව 2022 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. | 2022 වර්ෂය වන විට ඉඩම් බදු මුදල් පිළිබඳ විස්තර ලබා ගැනිම පරිගණක පද්ධතිය මඟින් සිදු කර ඇත. තව ද මෙම මෘදුකාංගය තව දුරටත් සංවර්ධනය කළ යුතු අතර අදාළ සමාගම සමඟ සාකච්ඡා කර කඩිනම් පියවර ගන්නා බව දන්වා සිටිමි. | ඒකාබද්ධ ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමට පියවර ගත යුතුය. |
| (ඉ) | සභාව සඳහා, පූර්ණ ඒකාබද්ධ පරිගණක පද්ධතියක් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා 2002 වර්ෂයේ දී පෞද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණු රු.17,000,000 ක මුදල නැවත ලබා ගැනීමට හෝ අදාළ පරිගණක පද්ධතිය ස්ථාපිත කරගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාව කටයුතු කර නොතිබුණි. | 2022.10.21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා අවස්ථාවේදී ද, මේ සම්බන්ධව ප්‍රශ්න කර ඒ සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් පොදු ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශයේ ලේකම් වෙත නියෝග ලබා දෙන ලදී. ඒ අනුව, ලබාදුන් නිර්දේශ මත ඉඩම් අමාත්‍යාංශයේ විගණන අංශයෙන් විමර්ශනයක් ආරම්භ කර ඔවුන් විසින් 2022.11.28 දිනැතිව ලිපිය මගින් සඳහන් | පූර්ණ ඒකාබද්ධ පරිගණක පද්ධතියක් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ගෙවූ මුදල |

| | | | |
|---|---|---|---|
| | | කරන ලද්දේ පරිගණක මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමට අදාළ උපකරණ නොමැති බැවින් එම විමර්ශනය ඉදිරියට සිදුකර ගෙන යාමට නොහැකි බවයි.ඉන් අනතුරුව, කොමිෂන් සභාවේ පරිගණන පද්ධතිය ස්ථාපිත කිරීමේදී සිදුවී ඇති මූල්‍ය අක්‍රමිකතාව පිළිබඳව සියලු තොරතුරු 2023.05.18 වන දින පැවති 790 වැනි කොමිෂන් සභා වාරය වෙත ඉදිරිපත් කර ඇති අතර, මේ සම්බන්ධයෙන් නිතීපති දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ඉල්ලා විස්තරාත්මක වාර්තාවක් යැවීමට කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල් මගින් අධ්‍යක්ෂ (නීති) වෙත උපදෙස් ලබාදී ඇති අතර, ඒ අනුව මේ සම්බන්ධව කටයුතු සිදුකරමින් පවතී. | නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. මෙයට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව විනය/නෛතික පියවර ගත යුතුය. |
| (ඊ) | සභාවේ ඉඩම් මැනුම් කර නියමානුකූල කරන අවස්ථාවේ කට්ටි කරුවන්ගෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට යටත්ව ඉඩම් මැනුම් කර බලයලත් මිනින්දෝරුවන් හට 2019,2020 හා 2021 යන වර්ෂ වලදී ගෙවා තිබුණු එකතුව රු.33,229,487 ක මුදලින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.6,142,990 ක් පමණක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. | දැනට මැනුම් කර ඇති ඇතැම් ඉඩම් සම්බන්ධයෙන් CA(W)399/2022 යටතේ නමුණුකුල වැවිලි සමාගම විසින්ද, CA(W)161/2021 යටතේ තලවකැලේ වැවිලි සමාගම විසින්ද කොමිෂන් සභාව වගඋත්තරකරු කරමින් පෙත්සම්කාර සමාගම් විසින් කොමිෂන් සභාවට එරෙහිව තහනම් නියෝග ලබාගෙන තිබීම, 2019 වර්ෂයේ සිට පැවති කොවිඩ් වසංගතය හා රටතුළ පැවති අයහපත් ආර්ථික තත්ත්වය තුළ කට්ටිලාභීන් මුදල් ගෙවීමට ඉදිරිපත් නොවීම ප්‍රමාද වීමට හේතු වී ඇත. කෙසේ වෙතත් මෙම මුදල් අයකරගැනීමට අධ්‍යක්ෂ ඉඩම් වෙත උපදෙස් ලබා දී ඇත. | ඉඩම් කට්ටිකරුවන්ට ලබාදෙන අවස්ථාවේදී මැනුම් කර ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | කොමිෂන් සභාව විසින් අනුමත සේවක සංඛ්‍යාවට ඇතුළත් නොමැති ව්‍යාපෘති හා විමර්ශන අධ්‍යක්ෂ, ව්‍යාපෘති සම්බන්ධීකාරක, විමර්ශන නිලධාරී, නීති උපදේශක සහ නීතිඥ යන සේවාවන් වල රාජකාරී ඉටුකර ගැනීම සඳහා 14 දෙනෙකු බඳවාගෙන තිබුණි. අදාළ සේවා ගිවිසුම්වලට එළඹීමට හෝ නිශ්චිතව පවරන ලද රාජකාරියක් ඉටුකරවා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට නිලධාරීන් 11 දෙනෙකුට රු.4,768,944 ක මුදලක් ගෙවා තිබුණි. | 1972 අංක 01 දරන පනතේ කොමිෂන් සභාව සම්බන්ධයෙන් අමාත්‍යවරයාට පවතින බලතල අනුව, එකී පනතේ 47 (3) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධව විමර්ශනය කර වාර්තා කිරීමසඳහා තැනැත්තෙකු/තැනැත්තියක පත්කිරීමේ බලතල අනුව අමාත්‍යවරයා 14 දෙනාගේ සේවය ලබාගෙන ඇති අතර, ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 47 (3) වගන්තිය ප්‍රකාරව අවශ්‍ය පත්වීම් ලබාදීමට කොමිෂන් සභාව විසින් කටයුතු කර ඇත.ඉඩම් අමාත්‍යතුමා අදාළ පත්වීම්ලාභීන්ට අමාත්‍යවරයා විසින් නිශ්චිතව පවරනු ලබන රාජකාරි පිළිබඳව වාර්තා අමාත්‍යවරයා වෙත යොමු කළ යුතුව ඇත. එසේ වුවත් | සේවා ගිවිසුම් වලට එළඹීමට සහ අදාළ විමර්ශනය නියමිත කාලය තුළ අවසන්කිරීමත් කළ යුතු අතර කාර්යසාධනය සම්බන්ධයෙන් වාර්තා පවත්වා ගැනීම හා ඇගයීම ද සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අදාළ පත්වීම් කොමිෂන් සභාව විසින් ලබා දී ඇති බැවින්, 2022.02.28 දිනැතිව සහ 2022.03.22 දිනැතිව විමර්ශන අධ්‍යක්ෂවරුන් වෙත ලිඛිතව රාජකාරි පවරා ඇති අතර, වරින් වර ඔවුන් වෙත විවිධ රාජකාරි වාචිකව පැවරීම ගරු අමාත්‍යතුමා සහ මා විසින් සිදුකොට ඇත. ඔවුන් විසින් මාසිකව කරනු ලබන රාජකාරි විධායක අධ්‍යක්ෂවරයා වෙත ඔවුන් විසින් වාර්තා කිරීමෙන් අනතුරුව එකී ලේඛන පදනම් කරගෙන ගෙවීම් කිරීමට කටයුතු කර ඇත. | |
| (ඖ) | කොමිෂන් සභාවට අයත් නාවලපිටිය ටිල්ටන් වත්ත ඉඩමේ තේ කර්මාන්ත ශාලාව සහිත අක්කර 02 රූඩ් 01 පර්චස් 05 ක ප්‍රමාණය තිස් අවුරුදු බදු පදනම මත 1997 අගෝස්තු 30 දින සිට වාර්ෂික බදු කුලිය රු.270,000 බැගින් පුද්ගලික සමාගමක් වෙත ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1) (ආ) වගන්තිය යටතේ බදු දී තිබුණි. පසුව 2008 වර්ෂයේදී එම සමාගම විසින් වෙනත් පෞද්ගලික බදුකරුවකුට එම සමාගමේ වෙළඳනාමය සමඟ මෙම ඉඩම පවරා තිබුණි. එහෙත් 1997 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා වසර 25 ක් වෙනුවෙන් අයවිය යුතු රු.18,403,926 ක හිඟ බදු අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හෝ,ඉඩම නැවත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර බදු ගිවිසුමක් ලබා දීම හෝ කිසිදු බද්දක් නොගෙවා බාහිර පාර්ශවයක් ඉඩම පරිහරණය කිරීම සම්බන්ධයෙන් සොයා බැලීමක්ද කර නොතිබුණි. | නාවලපිටිය පිහිටි ටිල්ටන් වත්ත ඉඩමේ අක්. 02 රූ. 1 පර්. 05 ක ප්‍රමාණය වසර 30 ක් සඳහා පුද්ගලික සමාගමක් වෙත පවරා දී තිබුණි. ඉන්පසුව 2008 වසරේදී තිලක් කුමාර උඩුගම නැමැත්තා විසින් මෙම ඉඩම් කොටස පවරාගෙන 2022 වසර දක්වා බදු ගෙවීම කර නොතිබුණි.ඒ හේතුවෙන් නාවලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 79899/18 හා 2021.03.26 දිනැති නඩු තීන්දුව ප්‍රකාරව ඔහුව මෙම දේපළින් නෙරපීම සඳහා නියෝගයක් නිකුත් කර ඇත. 2022.11.09 දිනැති කොමිෂන් සභා වාරයේදී හිඟ බදු මුදල අයකරගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ නීති වෙතින් වාර්තාවක් ලබා ගෙන ගත යුතු ඉදිරි පියවර පිළිබඳව දිස්ත්‍රික් කාර්යාලය දැනුවත් කර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | හිඟ බදු අය කර ගැනීමටත්ඉඩම නැවත පවරා ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | කොළඹ දිස්ත්‍රික්කයේ ටෙම්පල්බර්ග් වත්ත ඉඩමට සර්වේ ජනරාල් විසින් සකසන ලද අංක 8749 දරන 2005 නොවැම්බර් 27 දිනැති පිඹුරේ කැබලි අංක 32,34 සහ 35 ට අදාළ අක්කර 02 රූඩ් 01 පර්චර්ස් 30 ක් සහ එම ඉඩමේ කැබලි අංක 31 වන හෙක්ටයාර් 0.1877 ක ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1) (ආ) වගන්තිය යටතේ කම්බි නිෂ්පාදන හා ගැල්වනයිස් කිරීමේ නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් සඳහා වසර 30 ක් දක්වා භුක්තිය භාර දුන් වර්ෂ පදනම්ව වසර පහෙන් පහට බදු සමාලෝචනය කිරීමේ පදනම මත බදු දී තිබුණි. එහෙත් 2022 දෙසැම්බර් 31 දිනට සභාව වෙත ලැබිය යුතු සම්පූර්ණ බදු කුලිය වූ රු.32,475,109 කින් කිසිදු මුදලක් මේ දක්වා අයකර නොතිබුණු අතර එම ආයතනය වෙත බදු ගිවිසුමක් ලබා දීමටද අපොහොසත් වී ඇති බවත් තවදුරටත් නිරීක්ෂණය විය. | ටෙම්පල්බර්ග් වත්ත හෙවත් ලේලන්ඩ් වත්ත ඉඩමට අදාළව සර්වේ ජනරාල් විසින් මැන සකස් කරන ලද අංක 8749 දරන පිඹුරේ කැබලි අංක 31,32,34 හා 35 යන බිම් කොටස් කර්මාන්ත අමාත්‍යාංශය මඟින් රෙබිමෙක් සමාගම් සමූහය වෙත භුක්තිය භාර දී ඇත.ප්‍රමාණය පර්චස් 450 කි.මෙම ඉඩම් කොටස් 04ට අදාළව 2022.12.31දිනට ලැබිය යුතු බදු මුදල වූ රු.32,475,109ක මුදල 2023.07.30දින වන විට ගෙවීම් කරන බවට ආදායම් අංශය වෙත දැනුම් දී ඇති බවත් ඒ අනුව ඉදිරි පියවර ගන්නා බවත් දන්වා සිටිමි. | විධිමත් බදු ගිවිසුමක් මත ඉඩම් බදු දීමට හා හිඟ බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | කොමිෂන් සභාවේ ඉඩම් ලේඛනය සකස් කිරීම සඳහා 2018 ජූනි 27 දිනැති අංක අමප/18/1126/829/002 දරන කැබිනට් තීරණය මගින් වර්ෂයක කාලයක් සඳහා නිලධාරීන් 214 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇතත් ඔවුන්ව ස්ථිර පදනමින් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දී නොතිබුණි. එසේ තිබියදී බඳවා ගත් එම සේවකයන්ගෙන් 08 දෙනෙකු වෙත කොමිෂමේ පවතින පෞද්ගලිකව ඉඩම් ලබා දීමේ ක්‍රියාවලිය යටතේ ඉඩම් ලබා දීමට අදාළව පිඹුරු සංශෝධනයද සිදුකර ඔප්පු සකස් කිරීමට ඔප්පු අංශයට යොමුකර තිබුණු බවත් මෙම නිලධාරීන් බඳවා ගෙන තිබුණේ ඉඩම් ලේඛනය සකස් කිරීමේ කටයුතු සිදු කිරීමට වුවත් එම කාර්යයද ඉටු නොවී තිබියදී මෙසේ සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය. | කොමිෂන් සභාවේ ක්‍රියාත්මක සේවකයින්ට ඉඩම් කොටස් ලබාදීමේ තීරණයන් අනුව මූලික සුදුසුකම වනුයේ කොමිෂන් සභාවේ අඛණ්ඩව වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීමත් විනය විරෝධී කටයුත්තකට හසු නොවීමත් යන්න වේ. ඒ අතුරින් ඇතැම් සේවක පිරිසක් දිස්ත්‍රික් කිහිපයකින් ඉඩම් කොටස් හඳුනා ගනිමින් අදාළ ඉඩම් කොටසින් ඉඩම් කොටසක් සේවක පදනම මත ලබා දෙන ලෙසට ඉල්ලා සිටීම මත ඊට අදාළ මූලික කාර්යයන් පවත්වාගෙන යාමට කටයුතු කර ඇති නමුත් ඔවුන් වෙත මෙතෙක් ඉඩම් කොටසට අදාළ ඔප්පුව ලබාදීම සිදු කර නොමැත.කෙසේ වෙතත් ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර අනුමත කර ගැනීමට හෝ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට යෝජනා වි ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට හෝ නියමිත බවද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.තවද අංක 2/1/145(IV) හා 2023.05.24 දිනැති මාගේ අභ්‍යන්තර මාර්ගෝපදේශයක් මඟින් සේවකයින්ට ඉඩම් ලබාදීමේ ක්‍රමවේදය විධිමත් කිරීමට කටයුතු යොදා ඇත. | නීතියානුකූල නොවූ මෙම නිලධාරීන්ට ඉඩම් ලබාදීමේ ක්‍රියාවලිය වහාම නතර කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | කළුතර දිස්ත්‍රික්කයේ හැගල්ල වත්ත ඉඩමෙන් අක්කර 10 ක් තේ වගාකිරීමට පුද්ගලයෙකුට බදු පදනම මත ලබා දීමට අංක 8393 දරන 2013 අප්‍රේල් 30 දිනැති කොමිෂන් පත්‍රිකාවට අදාළ තීරණය අනුව කටයුතු කර තිබුණි. 2011 වසරේ සිට මෙම ඉඩමට අදාළ කිසිදු බදු මුදලක් අදාළ බදුකරු ගෙවා නොමැති අතර, වලංගු ගිවිසුමකට එළඹීමටද කටයුතුකර නොතිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත්කළ මූල්‍ය තත්ත්ව විස්තරය අනුව අයවිය යුතු රු.1,824,000 ක මුදල අයකර ගැනීමට හෝ ඉඩම පවරා ගැනීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | 2022.12.31 දිනට ලැබිය යුතු හිඟ බදු මුදල වූ රු.1,824,000න් රු.50,000ක මුදලක් 2023.01.12 දිනැතිව බදුකරු විසින් කළුතර දිස්ත්‍රික් කාර්යාලය වෙත ගෙවා ඇත.හිඟ බදු මුදල කඩිනමින් ගෙවන බවට බදුකරු විසින් ලිඛිත එකඟතාවය ලබා දී ඇත.හිඟ බදු මුදල අයකිරීමට සහ ඉඩමේ සන්තකය ආපසු පවරා ගැනීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට නීති අංශය දැනුවත් කර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදුකර වාර්තා කරන බව දන්වමි. | විධිමත් බදු ගිවිසුමක් මත ඉඩම් බදු දීමට හා හිඟ බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඕ) | ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22 (1) (ආ) වගන්තිය ප්‍රකාරව, ගාල්ල දිස්ත්‍රික්කයේ අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ලෙව්වම් බී වත්ත නැමැති ඉඩමෙන් අක්කර 08 ක් අවුරුදු 30 ක කාලයක් සඳහා වසර 5 න් 5 ට බදු සමාලෝචනය කරමින් 2005 වර්ෂයේ තක්සේරු වටිනාකමට එම වර්ෂයේ සිට "සහන ළමා සංවර්ධන පදනම" නැමති සංවිධානයට බදු පදනම මත ලබා දීමට 2014 වර්ෂයේදී කටයුතු කර තිබුණු අතර, අදාළ ඉඩම සම්බන්ධයෙන් ආරවුලක් ඇති වූ බව පවසමින් ඉඩමේ භුක්තිය ඒකපාර්ශිකව කොමිෂන් සභාව වෙත 2021 වර්ෂයේදී පවරාගෙන ඇති බව විගණනයට වාර්තාකර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දින වන විට හිඟව පැවති රු.6,998,800 ක මුදල සහන ළමා සංවර්ධන පදනමෙන් අයකර ගැනීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | 2022.12.31 දක්වා අයවිය යුතු බදු මුදල රු.6,998,800 කි.2005 සිට මේ දක්වා කිසිදු බදු මුදලක් ගෙවා නොමැති අතර තක්සේරු හා සේවා ගාස්තුවට අදාළව රු.50,000 ක් 2005.08.15 දිනැතිව ගෙවා ඇත. මෙම ඉඩමේ ගොඩනැඟිලි ඉදිකර වගා කරමින් ස්වාමීන් වහන්සේ විසින් භුක්ති විඳි අතර 2020.05.18 දිනැතිව උන් වහන්සේ අපවත් වී ඇත.බදු නොගෙවීම හා ස්වාමීන් වහන්සේ අපවත් වීම සම්බන්ධයෙන් 2021.03.26 දින පැවති කොමිෂන් සභා වාරයේ දී ඉඩමේ ඒකපාර්ශවීය භුක්තිය භාර ගැනීමට තීරණය කර ඇත.මෙම ඉඩම් කොටසට අදාළව වර්තමානයේ දී කොමිෂන් සභාව වෙත ලැබිය යුතු ආදායම් හෝ ලබා ගැනීමේ චේතනාවෙන් විශේෂ විමර්ෂණ නිලධාරි නාමල් ප්‍රේමවර්ධන මහතා විසින් 2022.07.20 දිනැතිව වාර්තාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව කොමිෂන් පත්‍රිකාවක් ඉදිරි කොමිෂන් සභා වාරය වෙත ඉදිරිපත් කිරීමට සකස් කර ඇත. | පවරාගත් ඉඩම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ අරමුණු වෙනුවෙන් යොදාගත යුතු අතර හිඟ බදු අය කර ගැනීමට ද පියවර ගත යුතුය. |
| (ක) | මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි බ්‍රේගෑප් නැමති ඉඩම සිදම්බරම් පිල්ලායි හා ඔහුගේ දරුවන් දෙදෙනෙකු වන සිදම්බරම් ජෙගදීසන් හා සිදම්බරම් රගුනාදන් වෙත අයත්ව තිබුණු අතර එම ඉඩම නකල්ස් රක්ෂිතයට අයත්වීම හේතු කොට ගෙන විකල්ප ඉඩම් ලබා දීමට කොමිෂන් සභාව කටයුතු කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |

| | | | |
|---|---|---|---|
| (i) | ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සෑම ව්‍යවස්ථාපිත නිශ්චයක්ම පනතේ 20 වගන්තියේ දැක්වෙන පරිදි එසේ පළ කරනු ලැබූ දිනයෙහි සිට ක්‍රියාත්මක විය යුතු අතර ව්‍යවස්ථාපිත නිශ්චයෙහි සඳහන් කෘෂිකාර්මික ඉඩම පිළිබඳ කිසිම අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවයක් එසේ පළ කරනු ලැබූ දිනයෙහි සිට කොමිෂන් සභාවට නොතිබිය යුතු වුවත්, එයට පටහැනිව පනතේ ප්‍රතිපාදන නොතිබියදී සිදම්බරම් රගුනාදන් වෙත බ්‍රේ ගෘප් වත්ත නමැති ඉඩමෙන් ලබාදී තිබුණු අක්කර 32 ක ප්‍රමාණය වෙනුවට කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ චන්ද්‍රිකා කුමාරතුංග මාවතේ පිහිටි ගනේමුල්ල කුඹුර නොහොත් ගනේතොට වත්ත ඉඩමෙන් අක්කර 11 ක් 2022 නොවැම්බර් 24 දින සිදම්බරම් රගුනාදන් යන අය වෙත ලබා දීමට කොමිෂන් සභාව කටයුතු කර තිබුණි. | 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වන වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත නිශ්චය ගැසට් පත්‍රයේ පලකළ පසු එකී ඉඩම පිළිබඳ කිසියම් අයිතිවාසිකමක් හිමිකමක් හෝ සම්බන්ධතාවක් කොමිෂන් සභාවට නොතිබිය යුතු බව 20 වන වගන්තියේ සඳහන් කර ඇත. එසේවුවද පනතේ 44 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට පවතින බලතල අනුව ඉඩම් හුවමාරු කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට කොමිෂන් සභාවට හැකියාව ඇති අතර පනතේ 47 වන වගන්තිය මඟින් ගරු විෂයභාර අමාත්‍යතුමාට පොදු හෝ විශේෂ විධාන කළ හැකි අතර කොමිෂන් සභාව විසින් ඒ විධාන ක්‍රියාත්මක කළයුතු වේ. ඒ අනුව සිදම්බරම් රෙගුනාදන් මහතා කොමිෂන් සභාවේ හිටපු විධායක අධ්‍යක්ෂක වෙත 2021.05.23 දින කරුණු ඉදිරිපත් කර ඇති අතර 2021.07.08 දින රැස් වූ කොමිෂන් සභාව ප්‍රකාශකගේ ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ලබා දී ඇති බ්‍රේගෘප් වත්තේ අක්: 50 රූඩ්: 0 පර්: 00 ක ප්‍රමාණයෙන් කොටසක් වෙනුවට කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල පිහිටි ගනේමුල්ල කුඹුර නොහොත් ගනේතොට වත්තෙන් අක්: 25 රූඩ්: 0 පර්: 00 ක ප්‍රමාණය ලබාදීම අනුමත කර ඇති අතර එකී අනුමැතිය සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය 2022.11.24 දින ලැබී ඇත. | පනතේ 44 හා 47 වගන්ති විගණන නිරීක්ෂණයට අදාළ නොවන හෙයින් මේ පිළිබඳ ස්වාධීන පරීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ii) | මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි බ්‍රේගෘප් නැමති ඉඩමට අදාළ ගැනුම්කරුවන් විසින් තමන්ට ලබා දී තිබුණු ඉඩම් නකල්ස් රක්ෂිතයට අත්කර ගැනීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කටයුතු කරන බව පවසා තිබුණු අතර, 2021 ජුලි 19 දින අධ්‍යක්ෂ ඉඩම් උපරිම සීමා විසින්, අධ්‍යක්ෂ මාතලේ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය අමතන ලද ලිපිය ප්‍රකාරව මහ/403 ප්‍රකාශක සිදම්බරන් රගුනාදන් යන අයට ව්‍යවස්ථාපිත නිශ්චය ලබා දී ඇති මාතලේ බ්‍රේ ගෘප් වත්ත ඉඩමෙහි නකල්ස් රක්ෂිතය සඳහා ඉඩම් අත්කර ගැනීමේ හිමිකම් පරීක්ෂණ පවත්වන අවස්ථා වලදී එම බිම් ප්‍රමාණ සඳහා කොමිෂන් සභාව වෙනුවෙන් වන්දි හිමිකම් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණි. ඒ | 2021.07.08 දින රැස් වූ කොමිෂන් සභාව මහ/403 ප්‍රකාශකගේ ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ලබා දී තිබූ බ්‍රේගෘප් වත්තෙන් කොටසක් සඳහා ගනේමුල්ල කුඹුර නොහොත් ගනේතොට වත්ත නැමති ඉඩමේ අක්:25 රූඩ්: 0 පර්: 00 ක ප්‍රමාණය ලබාදීම අනුමත කර ඇත. එකී අනුමැතිය අනුව අධ්‍යක්ෂ/ ඉඩම් උපරිම සීමා විසින් 2021.07.19 දිනැති ලිපිය මගින් මාතලේ දිස්ත්‍රික් අධ්‍යක්ෂ විසින් නකල්ස් රක්ෂිතයට අත්කර ගැනීමට යෝජිත මහ/403 ප්‍රකාශකගේ ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා වන්දි හිමිකම් පරීක්ෂණ පවත්වන අවස්ථාවේදී කොමිෂන් සභාව වෙනුවෙන් ඉදිරිපත් වන ලෙසට දන්වා ඇත. නකල්ස් රක්ෂිතයට අත්කර ගැනීමට යෝජිත ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ප්‍රකාශකට වන | ස්වාධීන පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුව ප්‍රකාශකට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඍජුව වන්දි ලබා ගැනීමට හැකියාව තිබියදී, පනතේ 19 වන වගන්ති යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් නොවන ඉඩමක් වෙනුවෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් වන්දි හිමිකම් ලබා ගැනීමට ඉදිරිපත් වීමට නෛතික හැකියාවක් නොමැති බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, විගණිත දින වූ 2022 දෙසැම්බර් 09 දින වන විටත් එකී වන්දිය කොමිෂන් සභාව වෙත හිමි වී නොතිබුණි. | සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් වන්දි ලබා ගැනීමට හැකියාව පැවතියද ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා විකල්ප ඉඩම් ලබා දීම කොමිෂන් සභාව අනුමත කර ඇති බැවින් බ්‍රේගෲප් වත්තේ ප්‍රකාශකගේ ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ලබා දී ඇති බිම් ප්‍රමාණය සම්බන්ධයෙන් හිමිකම් පෑමට කොමිෂන් සභාවට අවස්ථාව ඇත. ප්‍රාදේශීය ලේකම් ලග්ගල විසින් යොමු කර ඇති 2022.05.18 දිනැති ලිපිය අනුව බ්‍රේගෲප් වත්තේ සමස්ථ බිම් ප්‍රමාණය අත්කර ගැනීමට යෝජිත බව දැනුම් දී ඇත. | |
| (iii) | මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි බ්‍රේගෲප් නැමති ඉඩමේ සිදම්බරම් රගුනාදන් යන අයගේ ඉඩම සඳහා විකල්ප ඉඩම් ලබා දීමට 2021 ජූලි මස 08 දිනැති කොමිෂන් සභා තීරණය මගින් තීරණය කර තිබුණු අතර මෙම ඉඩම නකල්ස් රක්ෂිතයට අයත් වී ඇත්ද යන්න තහවුරු කර ගැනීම සඳහා ලග්ගල ප්‍රාදේශීය ලේකම් විමසා 2021 ජූලි මස 19 දින සහ 2022 අප්‍රේල් 26 දින ලිපි නිකුත් කර තිබුණි. මේ සඳහා පිළිතුරු කිසිවක් මහ/403 ගොනුව තුළ නොතිබුණි. ඒ අනුව නිවැරදි කරුණු තහවුරු කර ගැනීමකින් තොරව විකල්ප ඉඩම් පැවරීමට කොමිෂන් සභාව මතභේදාත්මක තීරණයක් ගෙන ඇති බව නිරීක්ෂණය විය. | සිදම්බරම් රෙගුනාදන් මහතාට විකල්ප ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවට කරුණු ඉදිරිපත් කිරීමේදී මාතලේ දිස්ත්‍රික් අධ්‍යක්ෂගේ 2021.06.28 දිනැති ලිපියෙන් ලබා දී ඇති වාර්තාවද කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ/මැණුම් හා වෙන් කිරීම් විසින් 2021.03.12 දිනැති තහවුරුවද යොමු කර ඇත. ලග්ගල ප්‍රාදේශීය ලේකම්ගෙන් 2022.04.26 දිනැතිව විමසා ඇති පැහැදිලි කිරීම සම්බන්ධයෙන් ලිපියක් 2022.05.18 දිනැතිව ලබා දී ඇති අතර එමගින් බ්‍රේගෲප් වත්තේ සමස්ථ බිම් ප්‍රමාණයම අත්කර ගැනීමට යෝජිත බව දැනුම් දී ඇත. එබැවින් කොමිෂන් සභාවට කරුණු ඉදිරිපත් කිරීමට පෙර මෙන්ම පසුවද නිවැරදි කරුණු තහවුරු කර ගැනීමට කටයුතු කර ඇත. | විකල්ප ඉඩම් ලබාදීමේදී නියමිත පරිදි කරුණු තහවුරු කර ගනිමින් සිදුකළ යුතුය. |
| (iv) | බ්‍රේගෲප් නැමති ඉඩමට අදාළ සිදම්බරම් රගුනාදන් යන අය විසින් අවස්ථා 7 කදී සහ සිදම්බරම් ජෙගදීසන් යන අය විසින් අවස්ථා 06 කදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ලිපි ඉදිරිපත් කර තිබුණු අතර එම ලිපි වල අත්සන් ව්‍යවස්ථාපිත නිශ්චය සිදු කරන ලද අවස්ථාවේදී තබන ලද අත්සන සමඟ වෙනසක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර මෙම ලිපි වල මුල් පිටපත් කිසිවක් ගොනුව තුළ නොවීය. එම ලිපි පරීක්ෂාවේදී තබා ඇති අත්සන් පරිලෝකනය (scan) කර ඇති බවට නිරීක්ෂණය විය. | සිදම්බරම් රෙගුනාදන් යන අය අවස්ථා 7 කදී විකල්ප ඉඩම් ඉල්ලා ඇති අතර ඉන් අවස්ථා තුනකම අදාළ මුල් පිටපත් මහ/403 ගොනුවේ ඇත. සිදම්බරම් ජෙගදීසන් යන අය අවස්ථා 6 කදී විකල්ප ඉඩම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර ඉන් අවස්ථා 2 කට අදාළ මුල් පිටපත් මහ/419 ගොනුවේ ඇත. මෙම ප්‍රකාශකයින් ව්‍යවස්ථාපිත ප්‍රකාශයන් ඉදිරිපත් කර වර්තමානය වන විට වසර 50 ක් ඉක්මවා ඇති බැවින් ප්‍රකාශන පත්‍රයේ තබා ඇති අත්සන හා වර්තමානයේ ඉල්ලීම් ලිපිවල තබා ඇති අත්සන් අතර යම් වෙනස්කම් පැවතීම පිළිබඳව අදාළ ප්‍රකාශකයා මගින් තහවුරු කර ගත යුතුය. | අත්සන්වල නිවැරදිභාවය කොමිෂන් සභාව විසින් තහවුරු කරගත යුත්තකි. එසේ නොකිරීම සම්බන්ධව පරීක්ෂණයක් සිදුකර කූට ලේඛන සකස් කිරීමක් සිදුව ඇත්නම් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (v) | අමාත්‍ය මණ්ඩලයේ ලේකම් විසින් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකර ඇති 2022 නොවැම්බර් 14 දිනැති අංක 22/විවිධ (063) දරන අමාත්‍ය මණ්ඩල තීරණයේ (i) නිර්දේශය අනුව අමප අංක 18/0828/738/006 දරන 2018 මැයි 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සිදු කරනු ලබන ඉඩම් බැහැර කිරීම් වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටවිය යුතු වුවත් 2022 නොවැම්බර් 24 දින සිදම්බරන් රගුනාදන් යන අයගේ ඇටෝර්නි බලය හිමි එච්.ටී.සරත් මයා වෙත කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රදේශිය ලේකම් කොට්ඨාශයේ චන්ද්‍රිකා කුමාරතුංග මාවතේ පිහිටි ගනේමුල්ල කුඹුර නොහොත් ගනේතොට වත්ත ඉඩමේ අක්කර 11 විකල්ප ඉඩම් වශයෙන් භාර දී තිබුණි. | 2022.11.14 දින අංක 22/විවිධ(063) දරන අමාත්‍ය මණ්ඩල නිර්දේශයන්හි හෝ අමප/18/0828/738/006 හා 2018.05.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයන්හි හෝ නීතිමය බැඳීම් සඳහා ඉඩම් නිදහස් කිරීම වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවිය යුතු බව සඳහන්ව නොමැත. එමගින් අක්කර 5 ක් දක්වා වූ ඉඩම් බදු පදනම මත බැහැර කිරිම අත්හිටුවා ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණ හා නිර්දේශය වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (vi) | කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ චන්ද්‍රිකා කුමාරතුංග මාවතේ පිහිටි ගනේමුල්ල කුඹුර නොහොත් ගනේතොටවත්ත ඉඩම, කේ.ඩී.එන්.අප්පුහාමි යන අයට අයත් අක්කර 42 පර්චස් 58 ක් වූ කුඹුරු ඉඩමක් 2011 නොවැම්බර් 28 දින කොමිෂන් සභා පනතේ 18 වැනි වගන්තිය අනුව සභාව වෙත අංක කො/1068 දරන ප්‍රකාශක විසින් ප්‍රකාශකර තිබුණු ඉඩමක් වන අතර, අදාළ කුඹුරු ඉඩම මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි බ්‍රේ ශෆ් වත්ත නමැති ගොඩ ඉඩමකට හුවමාරු කිරීමට කොමිෂන් සභාව කටයුතු කර තිබුණි. | කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ වැලිවිට ගමේ පිහිටි ගනේමුල්ල කුඹුර නොහොත් ගනේතොට ඉඩම නැමති ඉඩම ගනේමුල්ල කුඹුර යනුවෙන් හඳුන්වා තිබුණද එය ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යනු ලැබූ සහ එළවළු වගා කිරීම සඳහා භාවිතා කරන ලද ඉඩමක් බව කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ/මැනුම් හා වෙන් කිරීම් විසින් 2010.09.23 දින යොමු කර ඇති වාර්තාවේ පැහැදිලිව සඳහන් කර ඇත. | පනතේ ප්‍රතිපාදන නියමිත පරිදි අර්ථකතනය කර කටයුතු කළ යුතුය. |
| (vii) | කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ චන්ද්‍රිකා කුමාරතුංග මාවතේ පිහිටි ගනේමුල්ල කුඹුර නොහොත් ගනේතොට වත්ත ඉඩමේ අක්කර 25ක් රු.24,500,000 ක මුදලකට තීරණය කර පොදු ප්‍රතිපත්තිමය තීරණය අනුව 2022 අගෝස්තු 19 දිනට වටිනාකම රු.86,012,150ක් ලෙස නියෝජ්‍ය අධ්‍යක්ෂ (තක්සේරු හා වන්දි) විසින් අගය කර තිබුණි. ඒ අනුව, 1996 වර්ෂයේදී රු.6,125ක්ව පැවති පර්චසයක වටිනාකම 2022 වර්ෂය වන විට රු.21,503 ක් ලෙස තක්සේරු කර ඇතත් එහි වර්තමාන වටිනාකම ඊට අධික වන බව නිරීක්ෂණය කෙරේ. | කොමිෂන් සභාවේ නීතිමය බැඳීම් සඳහා විකල්ප ඉඩම් ලබා දීමේදී 603 වන කොමිෂන් සභා වාරය සඳහා 2009.12.22 දින රැස් වූ කොමිෂන් සභාව ලබා දී ඇති ප්‍රතිපත්තිමය තීරණය මත හුවමාරුවට යටත් වන බිම් කොටස් සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලබා ගැනීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව බ්‍රේගෲෆ් වත්තේ හා විකල්පව ලබා දෙන ගනේමුල්ල කුඹුර නොහොත් ගනේතොට ඉඩමේ තක්සේරුව ලබා ගැනීමට කටයුතු කර ඇත. මේ දක්වාම ඉහත පොදු ප්‍රතිපත්ති තිරිණය මත පදනම්ව ප්‍රකාශකයින් සඳහා විකල්ප ඉඩම් බැහැර කිරිම සිදු කරනු ලබයි. | නියමිත තක්සේරු වටිනාකම අනුව ඉඩම් බැහැර කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ග) | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු හොරණ, වැවල, හැගල්ල වත්ත බංගලාවත්ත ඉඩම කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාහේන උතුර 615 බී ග්‍රාම නිලධාරී වසමට අයත් ඉඩමෙහි නොබෙදූ අක්කර 14 රූඩ් 1 පර්චස් 9.9 ක ඉඩම තුළ හොරණ ඉසිපතනාරාමාධිපති ස්වාමීන් වහන්සේ විසින් අවිධිමත් ලෙස අක්කර 5 කට ආසන්න ප්‍රමාණයක්ද, තවත් පෞද්ගලික ඉඩම් හිමිකාරියක් අනවසර ලෙස පර්චස් 66 ඉක්මවූ ප්‍රමාණයක්ද , බුක්ති විඳින බව ලිපි ගොනුව අනුව නිරීක්ෂණය වූ අතර 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 16 වගන්තිය ප්‍රකාරව අනවසර භුක්තිකරුවන් නෙරපා හැරීමට නීතිමය කටයුතු කර නොතිබුණි. | ගිහිපැවිදි ප්‍රජානායක පුහුණු මධ්‍යස්ථානයක් සඳහා ඉසිපතනාරාමාධිපති පූජ්‍ය ගරු තන්ජම්තැන්නේ ධම්මරංසි හිමියන් විසින් බදු පදනම මත ඉල්ලීමක් කර එඅනුව 1581 පිඹුරෙන් අක්කර 4 රූඩ් 2 පර්චස් 00 ක නිරවුල් බිම් ප්‍රමාණයක් කොමිෂන් සභාව නමින් මැනුම් කිරීමට අංක 15/6/3626 හා 2021.11.08 දිනැති මැනුම් නියෝගය නිකුත් කරන ලදි. නමුත් සුජාතා වීරකෝන් යන අය අභියාචනා අධිකරණයේ අංක CA(W)576/2021 දරන නඩුව කොමිෂන් සභාවට විරුද්ධව ගොනු කිරීම නිසා මැනුම් කිරීමට නොහැකි වූ බැවින් බදු දීමට අදාළ ඉදිරි කටයුතු සිදු වි නොමැත. | අනවසර භුක්තිකරුවන් නෙරපා හැරීමට නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ච) | ගාල්ල දිස්ත්‍රික්කයේ ගල්ලිඳගාව වත්ත ඉඩමෙහි අක්කර 4 රූඩ් 2 පර්චස් 12.60 ක බිම් ප්‍රමාණයක් පුද්ගලික සමාගමක් භාවිත කරන අතර මෙම ඉඩම සඳහා 2016 වර්ෂයේ සිට සංශෝධිත තක්සේරු වටිනාකම් අනුව 2022 දෙසැම්බර් 31 දක්වා ගෙවිය යුතු මුළු බදු කුලිය රු.597,924 ක් විගණිත දිනය වූ 2023 ජූනි වන විටත් අයකරගෙන නොතිබුණි. | ගාල්ල දිස්ත්‍රික්කයේ ගල්ලිඳ වත්ත ඉඩමෙන් අක්කර රූඩ් 2 පර්චස් 12.6 ක ප්‍රමාණය ඉන්ටෙක්ස් මෝඩ් (පුද්) සමාගමට වසර 30 ක් සඳහා බදු පදනම මත අංක 625 දරන බදු ගිවිසුම ලබා දී තාවකාලික තක්සේරුව පදනම්ව බදු ගෙවා ඇත.2016 වසරට අදාළ තක්සේරුව 2021.12.05 දිනැතිව ලැබී ඇති අතර ඒ අනුව වසර 5 ට අදාළ බදු මුදලේ වෙනස ගළපා ඇත.(252,000 – 164,700 = 87,300) ඒ අනුව හිඟ බදු ගෙවන ලෙසට 2021.12.21 දිනැතිව බදුකරු දැනුවත් කළ අතර ඒ අනුව බදු මුදලෙන් කොටසක් ගෙවා ඇති අතර හිඟ මුදල ගෙවන ලෙසට 2023.03.10 දිනැතිව දැනුම් දී ඇත.නැවතත් සිහි කැඳවීමේ ලිපියක් 2023.07.06 දිනැතිව නිකුත් කර ඇති අතර ඒ අනුව ගෙවීම් නොකරන්නේ නම් නීතිමය පියවර තුළින් අයකර ගැනීමට ක්‍රියාකරන බවද දන්වමි. | හිඟ බදු අය කර ගත යුතුය. |
| (ඡ) | කොළඹ දිස්ත්‍රික්කයේ කොලොන්නාව වැල්ලම්පිටිය ප්‍රදේශයේ පිහිටි ජා කොටුව වත්ත ඉඩමෙන් රූඩ් 01 පර්චස් 9.79 ප්‍රමාණයක කොමිෂන් සභා පනතේ 22(1) (ආ) වගන්ති යටතේ වාර්ෂික බදු කුලිය රු.1,590,000 ක් බැගින් පුද්ගලයෙකු වෙත පවරා තිබුණි. මෙම ඉඩමේ වෙළඳපළ වටිනාකම මත එය රු.26,500,000 කට රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කර ඇතත් එම තක්සේරු වටිනාකම මත ගණනය කරන ලද බදු කුලිය ඉතා ඉහළ අගයක් බැවින් එය ගෙවිය නොහැකි බව 2022 ජනවාරි 02 | 2021.07.19 දින බදුකරු දැනුවත් කර ඇතත් තක්සේරු වටිනාකම ඉතා ඉහළ අගයක් බැවින් හා මෙම ව්‍යාපාරය තුළින් උපයන ආදායමෙන් මෙම බදු මුදල ගෙවීම කිසිසේත් සිදුකළ නොහැකි බැවින් නැවත බදු සංශෝධනය කර දෙන ලෙසට ඉල්ලීම් කර ඇත. ඒ අනුව අධ්‍යක්ෂ/ තක්සේරු හා වන්දි විසින් 2022.01.07 දිතැතිව තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී තිබුණද එය වෙනස් කිරීමට නොහැකි බව තක්සේරු දෙපාර්තමේන්තුව දන්වා ඇත.බදුකරුවන් විසින් නැවතත් | ඉඩම් තක්සේරු කර බදුදීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දින බදුකරු දන්වා තිබුණි. ඒ අනුව මෙම ඉඩම නැවත තක්සේරු කර බදු දීමේ කටයුතු අවසන් කිරීම විගණිත දින වූ 2023 ජුනි දක්වාම සිදුකර නොතිබුණි. | තක්සේරුව පිළිගත නොහැකි බවත් නැවත එය තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස අභියාචනයක් මෙම කොමිෂන් සභාව වෙත යොමුකර ඇත. ඒ පිළිබඳව නැවතත් 2023.07.04 දින තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. එකී තක්සේරු වාර්තාව ලැබුණු පසුව අවසන් තීරණයක් ගෙන ඔබ වෙත දැනුම් දෙමි. | |
| (ට) | කොමිෂන් සභාව විසින් බදු දුන් ඉඩම් වසර 5 න් 5ට තක්සේරුකර ගිවිසුම් අලුත්කළ යුතු අතර එම ඉඩම් වල තක්සේරුව හා ඒ අනුව අයකරගන්නා බදු මුදල් වටිනාකම වෙනස් විය යුතු බවට සභාව ඉඩම් බදු දීමේදී පනවනු ලබන කොන්දේසියක් වේ. ඒ අනුව ඉඩම් වල තක්සේරු බදු වටිනාකම් ලබාගැනීම සභාවේ වගකීමකි. එසේ වුවද දිවුලපිටිය ස්මාර්ට් ෂර්ට් ලංකා ආයතනය හා මීරිගම ජ්ලාන්ටේෂන් යන ආයතන සඳහා බදු දී ඇති ඉඩම් වල සංශෝධිත තක්සේරු වාර්තා ලබාගෙන නොතිබුණි. | තක්සේරුව ලැබීම ප්‍රමාදවීම පිළිබඳව අධ්‍යක්ෂ තක්සේරු හා වන්දි 2022.09.20 දින නැවත සිහිකැඳවීමක් යොමු කර ඇත. | නියමිත පරිදි තක්සේරු කර බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඩ) | කළුගල් ඉඩම් බදු දීමේදී මධ්‍යම පරිසර අධිකාරියේ හා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය යන ආයතන වල නිර්දේශය ලබාගෙන වසරක කාලයක් සඳහා බල පැවැත්වෙන පරිදි ලිඛිත බදු ගිවිසුම් ගතව කළුගල් ඉඩම් බදු දිය යුතු බව 2017 පෙබරවාරි 07 දිනැති අංක 9676 වැනි කොමිෂන් සභා වාරයේදී තීරණය කර තිබුණි. කළුගල් ආදායම් ලෙජරයට අනුව සභාවේ කළුගල් ඉඩම් බදුකරුවන් 93 දෙනෙකු වෙත බදු දී තිබුණු අතර මේ පිළිබඳ නියැදි පරීක්ෂාවේදී බදු ගොනුවල සභාව හා අදාළ බදුකරු අතර ඇති වූ බදු ගිවිසුම් නොතිබීම, මධ්‍යම පරිසර අධිකාරියේ හා භූ විද්‍යා හා පතල් කාර්යාංශය යන ආයතන මගින් ලබාගත යුතු වාර්ෂික නිර්දේශ ලබාගෙන නොතිබීම, අදාළ පළාත් පාලන ආයතන වලින් වාර්ෂිකව ලබා ගත යුතු වෙළෙඳ බලපත්‍ර ලබාගෙන නොතිබීම හා 2022 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු හිඟ කළුගල් බදු ආදායම් අයකරගෙන නොතිබීම යන අඩුපාඩු නිරීක්ෂණය විය. | බදු ලෙජරය සකස් කර බදුකරුවන් 93 කට අදාළව තොරතුරු නිවැරදිව සකස් කර ඇත.විධිමත් බදු ගිවිසුමක් ලබාදීමේදී ඊට අදාළ කොන්දේසි පිළිබඳව පාර්ශවයන් අතර එකඟතාවයෙන් යුතුව සිදු කළ යුතු වේ. කොමිෂන් සභාව විසින් තක්සේරු කරන ලද කියුබ් ප්‍රමාණයට අදාළ අගය සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් යොමු කර ඇති කියුබ් ප්‍රමාණයට අදාළ අගය පිළිබඳව බදුකරුවන් ඊට එකඟවීම පිළිබඳව අවසන් තීරණයට එළඹීමට ප්‍රමාද වී ඇති බැවින් තවදුරටත් ඒ සම්බන්ධව සාකච්ඡා කිරීම තුළින් ගිවිසුම් ලබාදීමට ප්‍රමාද වන බැවින් ඉහත තොරතුරු මත පදනම්ව කොමිෂන් සභාවේ අවසාන සංශෝධනයට යටත්ව බදු ගිවිසුම අත්සන් කිරීමට සති තුනක් ඇතුළත පියවර ගන්නා ලෙස අධ්‍යක්ෂ ව්‍යාපෘති වෙත දැනුම් දී ඇත.මධ්‍යම පරිසර අධිකාරිය හා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය යන ආයතන මගින් ලබාගත යුතු වාර්ෂික නිර්දේශ ලබාගනු ලබන්නේ වර්තමානයේ ක්‍රියාත්මක වන් ස්ටොප් ෂොප් (One Stop Shop) ක්‍රමවේදය යටතේ වන අතර එම නිර්දේශ ආකෘති අංක 02 යටතේ අප විසින් නිකුත් කරනු ලබන එකඟතා ලිපිය මඟින් එම ආයතන නිකුත් කරනු ලබයි. ඒ අනුව | හිඟ බදු ආදායම් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | එකී නිර්දේශ අප ආයතනය වෙත ලබාදීමක් සිදු නොවේ. ඒ අනුව වෙළඳ බලපත්‍රද ඉහත ක්‍රමවේදය යටතේම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ලබාගෙන බලපත්‍ර නිකුත් කරන බැවින් එහි පිටපත් අප ආයතනයට නොලැබේ.2022.12.31 දිනට අයවිය යුතු හිඟ බදු මුදල් අයකරගැනීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකසා ඉදිරිපත් කරනු ලැබූ අතර කොමිෂන් සභාවේ තීරණය වූයේ මේ සම්බන්ධයෙන් ආයතනික විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර නැවත එම නිර්දේශ සමග ඉදිරිපත් කරන ලෙසය. ඒ අනුව උක්ත කමිටුවේ සාකච්ඡාවට බඳුන් වූ අතර එම තීරණ පදනම්ව හිඟ බදු මුදල් අයකරගනිමින් පවතින අතර ඒ පිළිබඳව ඉදිරි කොමිෂන් සභා වාරය දැනුවත් කිරීමට නියමිතය. | |
| (ණ) | සමාලෝචිත වර්ෂය තුළ කළුගල් බදු ව්‍යාපෘති 6 ක් සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී අය වියයුතු බදු කුලිය රු.37,909,196 ක් වූ අතර එම බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | චමින්ද ජගත් කුමාර ගෙන් අයවිය යුතු බදු මුදල සඳහා හිඟ බදු මුදල් ගෙවන ලෙස දැනුම් දී ඇත.එකී මුදල නොගෙවන්නේ නම් ආදායම් අංශය මගින් තහවුරුවක් ලබාගැනීමෙන් පසු අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අධ්‍යක්ෂ නීති සහ අධ්‍යක්ෂ ව්‍යාපෘති වෙත උපදෙස් ලබා දී ඇත.සමන්ත කුමාර විජේසිරි, ඩබ්.එල්. සන්ධ්‍යානි, ධනපාල වන්නිආරච්චි, ලලිත් වන්නිආරච්චි යන බදු කරුවන් සඳහා වූ ඉඩම් කොටස් වලට අදාළ බලපත්‍ර නිකුත් කිරීමට පෙර අදාළ හිඟ බදු මුදල් අයකර බලපත්‍රය නිකුත් කරන ලෙසත් එසේ ගෙවීමට ඉදිරිපත් නොවන්නේ නම් බලපත්‍රය නිකුත් කිරීම අත්හිටුවීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසත් ආදායම් අංශය මගින් අධ්‍යක්ෂ ව්‍යාපෘති දැනුවත් කර ඇත. ප්‍රියංක ඒකනායක මයා ගෙන් අයවිය යුතු මුදල අයකරගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ව්‍යාපෘති වෙත උපදෙස් ලබා දී ඇත. | හිඟ බදු අය කර ගත යුතුය. |
| (ත) | කළුතර දිස්ත්‍රික්කයේ දොඩම්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි දීගල්ල වත්ත කළුගල් ඉඩමෙහි අක්කර 01 රූඩ් 3 ක ප්‍රමාණය මත සවි කර ඇති කළුගල් ඇඹරීමේ යන්ත්‍රයක බදු කුලිය සම්බන්ධව 2022 දෙසැම්බර් 13 දිනැති ලිපියට අනුව රු. 144,000 ක හිඟ කුලියක් අය වීමට ඇති බව | කළුගල් ව්‍යාපෘතියක් සඳහා වසරක කාලයක් සඳහා සහ ගල් ක්‍රෂරය සවිකිරීම සඳහා වසර 30 ක කාලයක් සඳහා එස්.ඩබ්.පී.පී.සුගතදාස මහතා වෙත බදු පදනම මත ලබා දීමට අනුමැතිය ලබා දී ඇත.ඒ අනුව 2020 වසරට අදාළ තක්සේරුව මත බදු මුදල් ගෙවන ලෙසට | උපයෝගී ලේඛන වල බදු කරුවන් ඇතුළත් කිරීම හා හිඟ බදු අය කර ගැනීමට ද පියවර ගත |

| | | | |
|---|---|---|---|
| | ලිපිගොනු අනුව තහවුරු වුවද එම ශේෂය බදු ලෙජරයේ සටහන් කර නොතිබුණි. | 2022.12.13 දිනැතිව බදුකරු දැනුවත් කර ඇත.ඒ අනුව 2022.12.31 දිනට ලැබිය යුතු බදු මුදල රු. 144,000 කි.මේ වන තෙක් අදාළ ගෙවීම් සිදුකර නැති බැවින් මෙම පැවරීම අවලංගු කරගිහ මුදල් අයකරගන්නා ලෙසත් අධ්‍යක්ෂ ව්‍යාපෘති වෙත දැනුම් දී ඇත. | යුතුය. |
| (ද) | කිසිදු නෛතික විධිවිධානයක් නොතිබියදී සභාපති සහ විධායක අධ්‍යක්ෂ සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.1,176,000 ක් නිවාස දීමනා හා සංග්‍රහ දීමනා ලෙස ගෙවා තිබුණි. | කොමිෂන් සභාවේ සභාපති සහ විධායක අධ්‍යක්ෂ වෙත නිවාස හා සංග්‍රහ දීමනා ගෙවීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතින් විමසීම් සිදු කළ අතර, එහිදී එම නිලධාරීන් වෙත සංග්‍රහ සහ නිවාස දීමනා ගෙවීම සම්බන්ධයෙන් එකඟවිය නොහැකි බව දන්වා ඇත. ඒ පිළිබඳව 2023.02.02 දිනැතිව පැවති 784 වැනි කොමිෂන් සභා වාරය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, එකී දීමනා ගෙවීම අත්හිටුවීම සිදු කර ඇත. | ගෙවන ලද අනුමත නොවූ දීමනා ආපසු අයකළ යුතුය. |

### 3.3 වාහන පද්ධතිය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාවිතයෙන් ඉවත් කළ වාහන 05 ක් වූ අතර ඉන් වාහන 03 ක් ධාවන තත්ත්වයේ නොපවතින බව කොමිෂන් සභාව විගණනයට වාර්තාකර තිබුණද වාහන දෙකක් 2022 වර්ෂයේ මාස 02 ක් ධාවනය කර ඉන් එක් වාහනයක් අලුත්වැඩියාවට යොමු කර මාස 10 කට වැඩි කාලයක් ගත වී ඇතත් එම අලුත්වැඩියාවන් අවසන් කර ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | PC-6653 කැබ් රථය 2021 වර්ෂයේ අග භාගයේදී එහි එන්ජිමේහි මතු වූ දෝෂය, දුරකථන නාමාවලිය අනුව එම ප්‍රදේශයේ පිහිටි ගරාජයක් වෙතින් රු. 485,380/- ක මුදලක් වැය කරමින් අලුත්වැඩියාව සිදුකරන ලද අතර, එහි වගකීම් කාලය තුළදිම, නැවත එන්ජිමේහි දෝෂයක් මතු වූ බැවින්, අලුත්වැඩියාව සිදුකළ ගරාජයේ එකඟතාවය මත වෙනත් ගරාජයකට යොමු කළද, එහි අලුත්වැඩියාව ඉටුකර දීම සම්බන්ධයෙන් ගරාජයේ එකඟතාවය පළ නොකරන ලදී. එබැවින්, වාහන අලුත්වැඩියා කටයුතු සිදුකර දෙන ලෙසද, නොඑසේනම් කොමිෂන් සභාව විසින් එම ආයතනයට විරුද්ධව නීති ක්‍රියාමාර්ග වලට එළඹෙන බව ද දන්වා ලිපි යොමු කර ඇත.251-7256 රථයේ කාර්මික දෝෂ අලුත්වැඩියාව සඳහා 2022 වර්ෂයේදි යොමු කළද, එම වර්ෂය තුළ රටේ පැවති ඉන්ධන හිඟබව සහ රටේ පැවති අර්බුදකාරි තත්ත්වය,වියදම් සීමා කිරීමේ තත්ත්වය මතද, එකී රථයේ අලුත්වැඩියාව ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවීම මත මතද, එම රථයේ අලුත්වැඩියා කටයුතු සිදුකිරීම ප්‍රමාද විය. කෙසේ වෙතත්, 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව එම රථය අලුත්වැඩියා කටයුතු මේ වන විට සිදුකර අවසන් කොට ඇත. | නොපමාව වාහනය අලුත්වැඩියා කරගත යුතුය. |
| (ආ) | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වාහන 15 ක් තිබුණද රියදුරන් 25 දෙනෙකු සිටින බව | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ රියදුරු සංචිතයේ රියදුරන් 25 දෙනෙකු සිටියද, කොමිෂන් සභාවේ සංචිත වාහන පවතිනුයේ 15 ක් පමණි. එම සංචිත රථ අතරින්ද | අතිරික්ත රියදුරන් සුදුසු පරිදි ඵලදායීව |

| | | |
|---|---|---|
| වාහන සම්බන්ධ පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | කිහිපයක් පසුගිය කාලය තුළ ධාවනය කළ නොහැකි තත්ත්වයක පසු වූ බැවින්, වාහන සංඛ්‍යාව ඉක්මවා රියදුරු සංඛ්‍යාවක් රාජකාරි සිදු කරන ලදී. කෙසේ වෙතත්, ඔවුන් වෙත මාසිකව වැටුප් ගෙවීම් සිදුකරන බැවින්, ඔවුන් එක් රථයකට රියදුරන් එක් අයෙකුට වඩා යොදවමින් රාජකාරි ඉටුකරවා ගැනීම සිදුකරන ලදී. තවද, අතිරික්ත රියදුරන් අතරින් දෙදෙනකු, ඉඩම් අමාත්‍යාංශය වෙත අනුයුක්ත කිරීමද සිදුකර ඇත. එමෙන්ම ධාවනය කළ නොහැකිව තිබුණු රථයේ නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව අලුත්වැඩියා කටයුතු මේ වන විට සිදුවෙමින් පවතින බැවින්, එකී කටයුතු නිම වීමෙන් පසු මෙම තත්ත්වය අවම වනු ඇත. | සේවයේ යොදවා ගත යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 02 දෙනෙක් සඳහා පුරප්පාඩු පිරවීමට හෝ සේවක අවශ්‍යතාවය පරිදි තනතුරු සංශෝධනය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | 2022.04.26 දිනැතිව අංක 03/2022 රාජ්‍ය වියදම් පාලනය කිරීම චක්‍රලේඛය නිකුත් වූ අතර, එමඟින් සියලු බඳවා ගැනීම් කල් තැබීම සිදු කරන ලද බැවින් හා 2022.08.22 දිනැතිව නිකුත් වූ පොදු ව්‍යාපාර චක්‍රලේඛ 04/2022 අනුව ද, සියලු බඳවා ගැනීම් වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවා ඇත.අත්‍යවශ්‍ය බඳවා ගැනීම් කටයුතු සිදුකිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තු වෙතින් විශේෂ අනුමැතියක් ලබාගත යුතුව ඇත. ඒ අනුව අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ පාලන යන බඳවාගැනීම් සඳහා 2023.01.16 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත් අතර දැනට අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා බඳවාගැනීමට ප්‍රසිද්ධ දැන්වීම් පළකර 2023.07.11 දිනැතිව සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. | අවශ්‍යතාවය පරිදි අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට හෝ පුරප්පාඩු පිරවීමට කොමිෂන් සභාව කටයුතු කළ යුතුය. |
| (ආ) | මධ්‍යම මට්ටමේ නිලධාරීන් 03 ක් ද කළමනාකරණ සහකාර නිලධාරීන් 126 ක් සහ ප්‍රාථමික නිලධාරීන් 18 ක් සහිතව මුළු නිලධාරීන් 147 ක් අනුමත කාර්ය මණ්ඩලයට පටහැනිව බඳවා ගෙන තිබුණ ද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2022.10.21 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමෙන් අනතුරුව 2022.11.03 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ අතිරික්ත කාර්යය මණ්ඩලය අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් නැවත සාකච්ඡාවක් පැවැත් වූ අතර, එම සාකච්ඡාවේ තීරණය පරිදි එම බඳවා ගත් කාර්යය මණ්ඩලය කොමිෂන් සභාවේ රාජකාරි අවශ්‍යතාවය මත ස්ථිර කාර්යය මණ්ඩලයට අනියුක්ත කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.ඒ අනුව, CP 23/0293/615/008 හා 2023.02.06 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා, අමප/23/0293/615/008 හා 2023.04.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී ඇත. | අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවාදෙපාර්තමේන් තුවේඅනුමැතිය ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 ජුනි 27 දිනැති අංක අමප/18/1126/829/002 දරන කැබිනට් තීරණය මගින් වර්ෂයක කාලයක් සඳහා නිලධාරීන් 214 දෙනෙකු බඳවාගෙන කාර්ය සාධනය අනුව වසර 3 ක කාලයක් සඳහා එම නිලධාරීන්ගේ සේවය දීර්ඝ කළ හැකි බව එහි දක්වා තිබුණද, අදාළ කාලය අවසන් වීමෙන් පසුව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව කළමනාකරණ සහකාර 138 ක්, රියදුරු 10 ක්, කාර්යාල සහයක 16 ක් සඳහා ස්ථිර පත්වීම් ලබාදී තිබුණි. | 2022.10.21 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමෙන් අනතුරුව 2022.11.03 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ අතිරික්ත කාර්යය මණ්ඩලය අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් නැවත සාකච්ඡාවක් පැවැත් වූ අතර, එම සාකච්ඡාවේ තීරණය පරිදි එම බඳවා ගත් කාර්යය මණ්ඩලය කොමිෂන් සභාවේ රාජකාරි අවශ්‍යතාවය මත ස්ථිර කාර්යය මණ්ඩලයට අනියුක්ත කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.ඒ අනුව, CP 23/0293/615/008 හා 2023.02.06 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර ඇත.ඒ සඳහා, අමප/23/0293/615/008 හා 2023.04.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී ඇත. | අදාළ කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂිකවාර්තාවපාර්ලිමේන්තුවේසභාගතකිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර ලේකම්ගේ 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛය සමඟ නිකුත් කළ, රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා වූ අත්පොතෙහි 6.6 ඡේදය ප්‍රකාරව සභාවේ වාර්ෂික වාර්තා භාෂා තුනෙන්ම මූල්‍ය වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2015 සිට 2021 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සම්බන්ධව 2023.05.03 දිනැතිව කැබිනට් මණ්ඩල සංදේශ කෙටුම්පතක් සහ ත්‍රෛභාෂාවෙන් සකස් කරන ලද 2021 වාර්ෂික වාර්තාවේ පිටපත් 05 ක් සහ CD තැටි 02 ක් 2023.05.16 දින ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. එමෙන්ම 2023.06.23 වන දින ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත 2015, 2016, 2017, 2018, 2019 සහ 2020 වාර්ෂික වාර්තා යොමු කරන ලදී. ඒ අනුව, ඉඩම් අමාත්‍යාංශය මඟින් ලබාදුන් උපදෙස් අනුව නැවත සකස් කරන ලද 2015, 2016, 2017, 2018, 2019 සහ 2020 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා 2023.06.26 දින සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |

### 4.2 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ නිකුත් කළ රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා වූ අත්පොතෙහි 2.3 ඡේදය ප්‍රකාර, | ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනට අනුගත වන පරිදි 2023-2027 සංයුක්ත සැලැස්මේ කෙටුම්පත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ මාර්ගෝපදේශය මත සකස් කර අවසන් කර ඇත. මෙම සංයුක්ත සැලැස්මේ | උපාය මාර්ගික සැලැස්ම නියමිත කාලයට සකස් කර එහි පිටපතක් විගණකාධිපති |

| | | | |
|---|---|---|---|
| | ආයතනය විසින් සකස් කළ යුතු උපාය මාර්ගික සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | කෙටුම්පතේ පිටපතක් සති තුනක් ඇතුළත කොමිෂන් සභා අනුමැතිය ලබාගැනීමෙන් පසු ඔබ වෙත ලබාදීමට කටයුතු කරමි. | වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂය තුළ හිමිකම් ලාභීන්ට රන්බිම ඔප්පු 20,000 ක් බෙදාදීමට සැලසුම් කර බෙදාදුන් ඔප්පු ප්‍රමාණය 2,422 ක් විය. එය සැලසුම් කළ ප්‍රමාණයෙන් සියයට 12 ක් වැනි අඩු අගයක් විය. | 2022 වර්ෂය තුළ බෙදාදුන් ඔප්පු ප්‍රමාණය 2,422 ක් ලෙස සඳහන් වුවද 2022 වර්ෂය තුළදී පිළියෙළ කරන ලද ඔප්පු ද ඇතුළත්ව මේ වන විට වැඩ අවසන් කරන ලද බෙදාදීම සඳහා කොමිෂන් සභාව සතුව පවතින ඔප්පු ප්‍රමාණය 2,450 ක් වේ. එසේම 2022 වර්ෂය තුළදී ඔප්පු ලබාදීමට යටත්ව ලබාදෙන ලද බලපත්‍ර සංඛ්‍යාව 448 ක් වන අතර 2022 වර්ෂය තුළ පිළියෙළ කරන ලද ගාල්ල දිස්ත්‍රික්කයට අයත් බලපත්‍ර 183 ක් 2023 වර්ෂය තුළ බෙදාදීමට කටයුතු කර ඇත. | වාර්ෂික සැළසුම් අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | බෞද්ධ ආගමික ස්ථාන වලට ඉඩම් ඔප්පු ලබාදීමේ ශාසනාභිවන්දනා වැඩසටහන සම්බන්ධයෙන් වර්ෂය තුළ සැලසුම් කළ 290 කින් ඉටු කර තිබුණේ 23 ක් වූ අතර එහි අගය සියයට 8 ක් වී තිබුණි. | ආගමික ස්ථාන 290 ක් වෙත 2022 වර්ෂයේදී ඔප්පු ලබාදීමට සැලසුම් කර ඇතත් ඔප්පු ලබාදීමේදී සලකා බලනු ලබන මූලික නිර්නායකය වන්නේ අදාළ ආගමික ස්ථානය ලියාපදිංචිගත ආයතනයක්ද යන්නවේ. මෙහිදී ලියාපදිංචිගතව පැවති ආයතන 23ක් පමණක් නියමිත තක්සේරු මුදල් ගෙවා ඔප්පු ලබාගැනීමට ඉදිරිපත් වීම මත නියමානුකූල කිරීමට පියවර ගෙන ඇති බව දන්වා සිටිමි. | වාර්ෂික සැළසුම් අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | වර්ෂය තුළ ඉඩම් ගැටලු විසදීමේ ජංගම සේවාවන් 44 ක් පැවැත්වීමට සැලසුම් කර පවත්වා තිබුණු සංඛ්‍යාව 2ක් වූයෙන් එහි ප්‍රගතිය සියයට 5 ක පමණ අඩු අගයක් ගෙන තිබුණි. | ජංගම සේවාවන් 44ක් පැවැත්වීමේ සැලසුම්ගත ඉලක්කය වර්ෂය තුල සපුරා ගැනීමට නොහැකි වුවද කාර්යය සාධනය යටතේ පවත්වා තිබූ ජංගම සේවා සංඛ්‍යාව 02ක් වශයෙන් සඳහන් කර තිබීම නිවැරදි නොවන බව වාර්තා කරමි. | වාර්ෂික සැළසුම් අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | බදු කුලී ආදායම් වර්ධනය කිරීම සඳහා බදු ගිවිසුම් සංශෝධනය කර ගිවිසුම නිකුත් කිරීම හා ප්‍රතිපත්ති හා නීති රීති අනුව සුදුසු පුද්ගලයන්ට හා ආයතන වලට බදු පදනම මත පවරා දීම් කිරීමට වර්ෂය තුළ කටයුතු කර නොතිබුණි. | බදු පදනම මත ඉඩම් බැහැර කර ඇති බදුකරුවන් සඳහා දීර්ඝකාලීන බදු ගිවිසුමක් ලබා දෙනු ලැබේ. දීර්ඝ කාලයක් සිට භුක්ති විඳින බදු මුදල් ද ගෙවන බදුකරුවන්ට අදාළ ව්‍යාපෘති කමිටු අනුමැතිය,කොමිෂන් සභා අනුමැතිය,ගරු විෂයභාර ඇමතිතුමාගේ අනුමැතිය, කැබිනට් අනුමැතිය නොමැති ගොනු දක්නට ලැබීම සහ මුල් වසර 05 ට අදාළ බදු මුදල් ගෙවා ඇති එහෙත් බදුකරුවන් බදු ගිවිසුම නොලැබීම මත වර්තමාන බදු නොගෙවා සිටින බදුකරුවන් සිටීම වැනි කරුණු හේතුවෙන් බදු ගිවිසුම් ලබා දීමට නොහැකි වී ඇත. 2023.07.13 දින පැවති කොමිෂන් සභාවේදී අභ්‍යන්තර නීතිඥවරුන්ට අමතරව බාහිර නීතිඥ මඩුල්ලක්ද මේ සඳහා පත්කර ඇත. | බදු ගිවිසුම් නියමිත පරිදි ලබාදී බදු පදනම මත ඉඩම් බැහැර කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කාර්ය සාධන සැලැස්ම තුළ ව්‍යවස්ථාපිත නිශ්චය ප්‍රමාණය ලෙස කාර්තුවකට 1 බැගින් වසරට 4 ක්, දක්වා එයින් 3ක කාර්යයන් ඉටු කර තිබුණි. වසරකට ඉටු කළ හැකි ව්‍යවස්ථාපිත නිශ්චය ප්‍රමාණය 4 ක් ද යන්න පිළිබඳ විගණනයේදී සෑහීමකට පත් විය නොහැකි විය. | ඉඩම් මැනුම් කිරීම සඳහා මායිම් පෙන්වා දීමත්, පිඹුරු සකස් කිරීමත් මෙම කොමිෂන් සභාවේ පාලනයෙන් තොරව සිදු වන්නක් බැවින් කාර්යය සාධන ඉලක්ක සපුරාගත නොහැකි බව දන්වමි.<br>කෙසේ වෙතත් ව්‍යවස්ථාපිත නිශ්චය ලබාදී අවසන් කළ යුතු තැනැත්තන් සංඛ්‍යාව 260 ක් ලෙස හඳුනාගෙන ඇති අතර එයින් ලිපිගොනු 05 ක කටයුතු අවසන් කර ඇති අතර ඉහත කරුණු නිරවුල් වන ආකාරය අනුව මෙම කටයුතුද අවසන් කළ හැකිවනු ඇත. | වසරක් තුළ ඉටුකළ හැකි ව්‍යවස්ථාපිත නිශ්චය ප්‍රමාණය නිවැරදිව තීරණය කළ යුතුය. |

**4.4 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය"හා 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශක හඳුනාගත යුතු වුවද, කොමිෂන් සභාව විසින් එවැනි දර්ශකයන් හඳුනාගෙන අරමුණුවලින් ළඟාකරගත් ප්‍රමාණය හා බැහැරවීම් මෙන්ම අවධානය යොමු කළයුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ සම්බන්ධවී2023-2027 වර්ෂ සඳහා වන සංයුක්ත සැලැස්මේ කෙටුම්පත අවසන් කර ඇත.එහිදි තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් බොහෝ දුරට අදාළ කර ගැනීම සිදුකර ගෙන ඇත. තවද, 2022 ඉන්ධන හිඟතාවය, ආර්ථික හා දේශපාලන අස්ථාවරත්වය හමුවේ එකී ඉලක්කයන්ට ළඟාවීමට නොහැකි වූ බැවින්, එය 2022 වර්ෂයේ අවසන් කාර්තුව සඳහා වන ක්‍රියාත්මක සැලැස්ම සංශෝධනය කර කොමිෂන් සභා අනුමැතිය ලබාගන්නා ලදී. කෙසේ වෙතත්, ඉදිරියේදී ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමේදී සියලු අංශ ආවරණය වන පරිදි සහ ඉතා අඩු මට්ටමක කාර්ය සාධනය පැවති අංශ කෙරෙහි අවධානය යොමු කොට, අදාළ සැලසුම් සකස් කිරීමේ කටයුතු සිදුකරනු ඇත. | තිරසාර සංවර්ධනය අරමුණු හඳුනා ගෙන ක්‍රියාත්මක කළ යුතුය. |